# 4

# මිල, වැටුප්, සේවා නියුක්තිය සහ ඵලදායිතාව

## 4.1 සමස්ත නිරීක්ෂණ

ජාතික පාරිභෝගික මිල දර්ශක අනුව මනිනු ලබන පොදු මිල මට්ටම, 2018 වසර තුළ දී පැවති යහපත් කාලගුණ තත්ත්ව හේතුවෙන් පහළ වැටුණු ආහාර අයිතමවල මිල විචලනයට බොහෝ සෙයින් අනුරූප විය. මේ අනුව, 2018 වසර තුළ දී වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය පහළ යන නැඹුරුතාවයක් පිළිබිඹු කළ අතර, වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන යටිදැරි උද්ධමනය පහළ මට්ටමක පැවතුණි. මනා ලෙස පාලනය වූ උද්ධමන අපේක්ෂා පැවතීම, බොහෝ ආනයනික අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල තීරණය කිරීම සඳහා පරිපාලිත මිල යාන්ත්‍රණ පැවතීම හා 2018 වසරේ අවසන් මාස දෙකේ දී තෙල් මිල පහළ යෑම යන කරුණු හේතුවෙන් 2018 වසරේ අග භාගයේ දී ශ්‍රී ලංකා රුපියලෙහි වූ ශීඝ්‍ර අවප්‍රමාණය, පාරිභෝගික මිල දර්ශක මත බලාපොරොත්තු වූ තරම් ඉහළ පීඩනයක් එල්ල නොකරන ලදී. උද්ධමන අපේක්ෂා පිළිබඳව සලකා බැලීමේ දී විශේෂයෙන්ම ව්‍යාපාර අංශයේ උද්ධමන අපේක්ෂා සැබෑ උද්ධමනයට බොහෝ සෙයින් අනුරූප විය. කෙසේ වුවද, පසුගිය වසරට සාපේක්ෂව 2018 වසරේ දී ව්‍යාපාර අංශයේ කෙටිකාලීන හා දිගුකාලීන උද්ධමන අපේක්ෂා අතර පරතරයේ වැඩිවීමක් දක්නට ලැබුණි. 2018 වසරේ දී, මූර්ත වැටුප්වල වර්ධනය පිළිබඳව සලකා බැලීමේ දී අවිධිමත් පෞද්ගලික අංශයේ පමණක් මූර්ත වැටුප්වල වැඩිවීමක් දක්නට ලැබුණු අතර ඇතැම් ක්ෂේත්‍රවල පැවති ශ්‍රම හිඟය ඒ සඳහා යම්තාක් දුරකට හේතු විය. එසේ වුවද, රාජ්‍ය සහ විධිමත් පෞද්ගලික අංශවල මූර්ත වැටුප්වල අඩුවීමක් දක්නට ලැබුණි. මෑත කාලීනව නිරීක්ෂණය කරන ලද ප්‍රවණතාවලට අනුගත වීමෙන් තොරව, ශ්‍රම බලකාය පසුගිය වසරට සාපේක්ෂව 2018 වසරේ දී පහළ යන ලදී. තවද, ශ්‍රම බලකාය තුළ ස්ත්‍රී පුරුෂ සහභාගිත්ව පරතරයේ වැඩිවීමක්, සේවා නියුක්ත පුද්ගලයන්ගේ අඩුවීමක් සහ සමස්ත සේවා වියුක්ති අනුපාතිකයේ වැඩිවීමක් 2018 වසර තුළ දී දක්නට ලැබුණි. ආර්ථිකයේ බොහෝ අංශ තුළ ශ්‍රම හිඟය පිළිබඳ ගැටලුවක් පැවතිය ද, තරුණ තරුණියන්, කාන්තාවන් හා ඉහළ අධ්‍යාපනික සුදුසුකම් ඇති පුද්ගලයන් අතර ඉහළ සේවා වියුක්තියක් දිගින් දිගටම දක්නට ලැබුණි. විදේශ රැකියා අවස්ථාවල අඩුවීමක් දක්නට ලැබුණ ද පසුගිය පස් අවුරුදු කාලසීමාව තුළ අඩුවෙමින් පැවති ගෘහ සේවිකා කාණ්ඩය යටතේ රැකියා සඳහා පිටව යන කාන්තාවන් සංඛ්‍යාවේ වැඩිවීමක් 2018 වසරේ දී දක්නට ලැබුණි. මේ අතර, 2018 වසරේ දී පෞද්ගලික අංශයේ කර්මාන්තවල සිදු වූ වැඩ වර්ජන හේතුවෙන් අහිමි වූ මිනිස් දින ගණන පෙර වසරට සාපේක්ෂව සියයට 14.4 කින් පහළ ගිය අතර, වතු අංශයේ එය සැලකිය යුතු ලෙස ඉහළ යන ලදී.

## 4.2 මිල

### පොදු මිල මට්ටමේ විචලන

**ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100)[1] මගින් මනිනු ලබන පොදු මිල මට්ටම, 2018 වසර තුළ මිශ්‍ර විචලන පෙන්නුම් කළ අතර, එම විචලන ආහාර කාණ්ඩයේ අයිතමවල මිල විචලනවලට බොහෝ සෙයින් අනුරූප විය.** 2018 වසරේ වැඩි කාලසීමාවක් තුළ පැවති යහපත් කාලගුණ තත්ත්ව හේතුවෙන්, සැපයුම් අංශයේ සිදු වූ වර්ධන, ආහාර කාණ්ඩයේ අයිතමවල මිල අඩු මට්ටමක පැවතීමට හේතු විය. ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් 2018 දෙසැම්බර් මාසය හැර අනෙකුත් මාසවල දී ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, මෙම මිල ගණන් පොදු මිල මට්ටමේ ඉහළ යෑම සඳහා සුළු වශයෙන් දායක විය.



**පෙර වසරවල දී මෙන්ම 2018 වසරේ දී ද ආහාර කාණ්ඩයේ දක්නට ලැබුණු මිල විචලන නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතමවල[2] මිල විචලනවලට බොහෝ සෙයින් අනුරූප විය.** 2018 වසරේ මුල් මාස හතරේ දී නිතර මිල උච්චාවචන සහිත ආහාර මිල ගණන්වල දක්නට ලැබුණු පහළ යෑමේ ප්‍රවණතාව සඳහා ප්‍රධාන වශයෙන් සහල්, එළවළු සහ ළූණු යන අයිතමවල දක්නට ලැබුණු මිල පහළ යෑම් හේතු වූ අතර ඊට අමතරව පොල්, නැවුම් මත්ස්‍ය සහ අර්තාපල් යන අයිතමවල විටින් විට සිදු වූ මිල පහළ යෑම් ද හේතු විය. අස්වනු නොමැති කාලයේ දී ඇති වූ අඩු සැපයුම් තත්ත්ව මත නැවුම් මත්ස්‍ය, එළවළු, අර්තාපල් සහ ළූණු යන නිතර මිල උච්චාවචන සහිත අයිතමවල මිල ගණන් මැයි සහ ජූනි මාසවල දී ඉහළ යන ලදී. ඉන් අනතුරුව, අගෝස්තු සිට ඔක්තෝම්බර් දක්වා කාලයේ දී නිතර මිල උච්චාවචන සහිත ආහාර මිල අඩු වූ අතර, මේ සඳහා සහල්, පොල්, නැවුම් මත්ස්‍ය සහ එළවළු මිලෙහි සිදු වූ පහළ යෑම් ප්‍රධාන වශයෙන් හේතු විය. නොවැම්බර් මාසයේ දී පැවති අහිතකර කාලගුණ තත්ත්ව මත සැපයුම් අංශයට සිදු වූ බාධා හේතුවෙන් මෙම කාණ්ඩයේ අයිතමවල මිල සැලකිය යුතු ලෙස ඉහළ යන ලදී. කෙසේ වුවත්, දෙසැම්බර් මාසයේ දී මෙම අයිතමවල මිල ගණන් සාපේක්ෂව පහළ මට්ටමක පැවතුණි. යහපත් කාලගුණ තත්ත්ව හේතුවෙන් යථා තත්ත්වයට පත් වූ වී නිෂ්පාදනය නිසා 2018 වසරේ දී සහල් වර්ගවල මිල ගණන් සාමාන්‍ය මට්ටමක පැවතුණි. යහපත් කාලගුණ තත්ත්ව හේතුවෙන් යථා තත්ත්වයට පත් වූ පොල් නිෂ්පාදනය සහ 2017 දෙසැම්බර් මාසයේ සිට පොල් මද ආනයනය කිරීම හේතුවෙන්, 2018 වසර මුළුල්ලේම පොල් මිල ගණන්වල පහළ යෑමක් දක්නට ලැබුණි. 2018 වසර ආරම්භයේ දී අඩු මට්ටමක පැවති නැවුම් මත්ස්‍ය මිල, 2018 දෙවන කාර්තුව තුළ දී ඉතා විශාල වශයෙන් ඉහළ ගිය අතර මේ සඳහා අයහපත් කාලගුණ තත්ත්ව හා රජය විසින් භූමිතෙල් මිල වැඩි කිරීමට එරෙහිව ධීවරයන් දැක් වූ විරෝධතා හේතුවෙන් සිදු වූ නැවුම් මත්ස්‍ය නිෂ්පාදනයේ පහළ යෑම හේතු විය. කෙසේ වුවද, 2018 ඉතිරි කාලපරිච්ඡේදයේ දී නැවුම් මත්ස්‍ය මිල ගණන්වල අඩුවීමක් දක්නට ලැබුණි.

1 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිල පාරිභෝගික දර්ශක වන ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100) මාසිකව සම්පාදනය කරනු ලබයි. ජා.පා.මි.ද. මගින් ජාතික මට්ටම නියෝජනය වන ලෙස තෝරාගත් පාරිභෝගික අයිතමවල මිල වෙනස් වීම් පෙන්නුම් කරනු ලබන අතර කො.පා.මි.ද. මගින් කොළඹ නාගරික ජනතාව නියෝජනය වන ලෙස තෝරාගත් පාරිභෝගික අයිතමවල මිල වෙනස්වීම් පෙන්නුම් කරයි.

2 සහල්, මස් වර්ග, නැවුම් මත්ස්‍ය සහ මුහුදු ආහාර, පොල්, පලතුරු, එළවළු, අර්තාපල්, ළූණු සහ තෝරාගත් කුළුබඩු වර්ග නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයට ඇතුළත් වේ.

**4.1 සංඛ්‍යා සටහන**


**තෝරාගත් ආහාර අයිතමවල සිදු වූ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සංශෝධන**

| අයිතමය | සංශෝධනයට පෙර (කි.ග්‍රෑ. 1 ක් සඳහා රුපියල්) | සංශෝධනයට පසු (කි.ග්‍රෑ. 1 ක් සඳහා රුපියල්) | බලාත්මක දිනය |
|---|---|---|---|
| ආනයනික ලොකු ළූණු | 1.00 | 40.00 | 02.05.2018 |
| | 40.00 | 20.00 | 04.12.2018 |
| ආනයනික අර්තාපල් | 30.00 | 40.00 | 02.05.2018 |
| | 40.00 | 20.00 | 04.12.2018 |
| පරිප්පු | | | |
| පියළි නොකළ | 1.00 | 7.00 | 09.05.2018 |
| | 7.00 | 2.00 | 02.11.2018 |
| පියළි කළ | 3.00 | 12.00 | 09.05.2018 |
| | 12.00 | 7.00 | 02.11.2018 |
| ආනයනික සහල් | 2018 අප්‍රේල් 30 වන දින දක්වා කි.ග්‍රෑ. 1 කට සත 25 ක්ව පැවැතුණි. (අ) | | |

(අ) 2018 මැයි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි කිලෝග්‍රෑමයකට රුපියල් 50 හෝ මිල, රක්‍ෂණය, ගැල් කුලී (CIF) අගයෙන් සියයට 30 යන දෙකෙන් ඉහළ අගය, සාමාන්‍ය බද්දක් ලෙස පනවන ලදි. තවද, සියයට 15 ක එකතු කළ අගය මත බද්ද, සියයට 7.5 ක වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන බද්ද සහ සියයට 2 ක ජාතිය ගොඩ නැඟීමේ බද්දක් ද ආනයනික සහල් මත පනවන ලදි.

මූලය: මුදල් අමාත්‍යාංශය

**4.1 රූප සටහන** **2018 වසරේ මිල, වැටුප් සහ සේවා නියුක්තිය සංක්ෂිප්තයක් ලෙස...**



**4.2 සංඛ්‍යා සටහන**

**දේශීයව නිෂ්පාදිත සහ ආනයනික ප්‍රධාන අයිතමවල සිල්ලර මිල ගණන්**




| අයිතමය | | | ඒකකය | වාර්ෂික සාමාන්‍ය | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | මිල - රුපියල් | | | ප්‍රතිශත වෙනස | |
| | | | | 2016 | 2017 | 2018 | 2017/ 2016 | 2018/ 2017 |
| දේශීය | සහල් | - සම්බා | කි.ග්‍රෑ. 1 ක් | 92.75 | 98.79 | 109.33 | 6.5 | 10.7 |
| | | රතු කැකුළු | කි.ග්‍රෑ. 1 ක් | 69.52 | 87.94 | 83.18 | 26.5 | -5.4 |
| | | සුදු කැකුළු | කි.ග්‍රෑ. 1 ක් | 72.12 | 83.64 | 83.35 | 16.0 | -0.3 |
| | | නාඩු | කි.ග්‍රෑ. 1 ක් | 78.71 | 94.37 | 95.08 | 19.9 | 0.8 |
| | උඩරට එළවළු | - බෝංචි | කි.ග්‍රෑ. 1 ක් | 204.75 | 192.36 | 241.09 | -6.1 | 25.3 |
| | | කැරට් | කි.ග්‍රෑ. 1 ක් | 188.86 | 193.98 | 237.94 | 2.7 | 22.7 |
| | | ගෝවා | කි.ග්‍රෑ. 1 ක් | 154.71 | 155.38 | 177.64 | 0.4 | 14.3 |
| | | බීට්රූට් | කි.ග්‍රෑ. 1 ක් | 165.81 | 163.14 | 182.43 | -1.6 | 11.8 |
| | පහතරට එළවළු | - වම්බටු | කි.ග්‍රෑ. 1 ක් | 133.08 | 161.72 | 167.32 | 21.5 | 3.5 |
| | | බණ්ඩක්කා | කි.ග්‍රෑ. 1 ක් | 139.29 | 148.89 | 167.02 | 6.9 | 12.2 |
| | | වැටකොළු | කි.ග්‍රෑ. 1 ක් | 155.58 | 192.23 | 177.71 | 23.6 | -7.6 |
| | | කරවිල | කි.ග්‍රෑ. 1 ක් | 200.51 | 236.98 | 229.05 | 18.2 | -3.3 |
| | පොල් (මධ්‍යම ප්‍රමාණය) | | ගෙඩියක් | 46.12 | 67.67 | 69.31 | 46.7 | 2.4 |
| | මාළු (කෙළවල්ලා) | | කි.ග්‍රෑ. 1 ක් | 860.68 | 950.17 | 956.40 | 10.4 | 0.7 |
| | බිත්තර | | එකක් | 16.10 | 14.08 | 16.10 | -12.5 | 14.3 |
| ආනයනික | සීනි | | කි.ග්‍රෑ. 1 ක් | 100.69 | 107.48 | 107.73 | 6.7 | 0.2 |
| | කිරි පිටි | | ග්‍රෑ. 400 ක් | 325.00 | 325.00 | 337.33 | 0.0 | 3.8 |
| | රතු පරිප්පු | | කි.ග්‍රෑ. 1 ක් | 191.16 | 180.52 | 148.50 | -5.6 | -17.7 |
| | පාන් පිටි | | කි.ග්‍රෑ. 1 ක් | 89.66 | 89.33 | 91.59 | -0.4 | 2.5 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**ආහාර කාණ්ඩයේ නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතම හැර අනෙකුත් අයිතමවල මිල, නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතමවල මිල විචලනයට ප්‍රතිවිරුද්ධව විචලනය වෙමින් 2018 වසර තුළ දී ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලද අතර, මේ සඳහා කිරිපිටි, කරවල, පාන්, තිරිඟු පිටි, ටින්මාලු වැනි අයිතමවල විටින් විට සිදු වූ මිල ඉහළ යෑම් ප්‍රධාන වශයෙන් හේතු විය.** ජාත්‍යන්තර වෙළඳපොළෙහි සිදු වූ මිල වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් අවුරුදු 3 ක පමණ කාලයකට පසුව 2018 මැයි 04 වන දින කිරිපිටි ග්‍රෑම් 400 පැකැට්ටුවක මිල රුපියල් 20 කින් ඉහළ දමන ලදී. කෙසේ වුවද, 2018 සැප්තැම්බර් 19 වන දින සිට බල පැවැත්වෙන පරිදි කිරිපිටි කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 50 ක රේගු බදු සහන ලබා දෙන ලදී. තිරිඟු පිටි හා පාන්වල මිල ගණන් පිළිවෙලින් 2018 සැප්තැම්බර් 01 සහ 04 වන දිනයන්හි සිට බල පැවැත්වෙන ලෙස රුපියල් 5 කින් ඉහළ නංවන ලදී. 2017 වසර තුළ දක්නට ලැබුණු සීනි මිල ඉහළ යෑමේ ප්‍රවණතාවට ප්‍රතිවිරුද්ධව යමින් 2018 වසර තුළ සමස්ත වශයෙන් සීනි මිල පහළ යෑමේ ප්‍රවණතාවක් දක්නට ලැබුණු නමුත් 2018 සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසවල දී සීනි මිල සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. තවද, ඉහළ ගිය මිල පාලනය කර ගැනීම සඳහා 2018 ඔක්තෝම්බර් 13 වන දින සිට, ඇසුරුම් නොකළ සහ ඇසුරුම් කළ සුදු සීනි කිලෝග්‍රෑමයක් සඳහා පිළිවෙලින් රුපියල් 100 ක හා රුපියල් 105 ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. 2018 මැයිමාසයේ දී ඉහළ දමන ලද පරිප්පු සඳහා වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, නොවැම්බර් මාසයේ දී පහළ දමන ලද අතර මේ හේතුවෙන් 2018 වසර මුළුල්ලේම පරිප්පු මිල ගණන්වල අඩුවීමක් පෙන්නුම් කරන ලදී. එමෙන්ම මෑත වසරවලට සාපේක්ෂව වාර්තා වූ අඩුම පරිප්පු මිල ගණන් 2018 වසරේ දී දක්නට ලැබුණි.

**ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් 2018 දෙසැම්බර් මාසයේ හැර ඉතිරි කාලපරිච්ඡේදයේ දී ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.** ලෝක වෙළඳපොළ මිල විචලනවලට අනුරූපීව දේශීය ඉන්ධන මිල තීරණය කරනු ලැබීම සඳහා ඉන්ධන මිල සූත්‍රයක් හඳුන්වා දුන් අතර, ඒ අනුව 2018 මැයි, ජූලි, සැප්තැම්බර් සහ ඔක්තෝම්බර් මාසවල දී ඉන්ධන මිල ඉහළ දමන ලද අතර නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල දී ඉන්ධන මිල පහළ දමන ලදී. ඉන්ධන මිල ගණන්වල සිදු වූ වෙනස්කම්වලට අනුව, බස් ගාස්තු හා ත්‍රීවීලර් ගාස්තුවල සංශෝධන ද මෙම වසර තුළ දී සිදු විය. මේ අතර, වසර 10 කට පසුව සියයට 15 ක දුම්රිය ගාස්තු ඉහළ දැමීමක් 2018 ඔක්තෝම්බර් 01 වන දින සිට සිදු කරන ලදී. කෙසේ වුවද, පැවති අවම දුම්රිය ගාස්තුවෙහි වෙනසක් සිදු නොකරන ලදී. ලෝක වෙළඳපොළෙහි, ගෑස් මිල ගණන්වල සිදු වූ වැඩිවීම සහ ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල

**4.2 රූප සටහන** **ආහාර නොවන අයිතමවල සිදු වූ පරිපාලිත මිල සංශෝධන - 2018**

| | | සංශෝධනයට පෙර | සංශෝධනයට පසු | මිල සංශෝධනය | බලාත්මක දිනය |
|---|---|---|---|---|---|
| පෙට්‍රල් 92 (අ) (රුපියල්)  | සිපෙට්කෝ (ආ) | 117.00 | 137.00 | 20.00 | 11.05.2018 |
| | | 137.00 | 145.00 | 8.00 | 11.07.2018 |
| | | 145.00 | 149.00 | 4.00 | 11.09.2018 |
| | | 149.00 | 155.00 | 6.00 | 11.10.2018 |
| | | 155.00 | 145.00 | -10.00 | 02.11.2018 |
| | | 145.00 | 140.00 | -5.00 | 16.11.2018 |
| | | 140.00 | 135.00 | -5.00 | 01.12.2018 |
| | | 135.00 | 125.00 | -10.00 | 22.12.2018 |
| | ලංකා IOC (ඇ) | 126.00 | 137.00 | 11.00 | 11.05.2018 |
| | | 137.00 | 146.00 | 9.00 | 06.07.2018 |
| | | 146.00 | 150.00 | 4.00 | 11.09.2018 |
| | | 150.00 | 155.00 | 5.00 | 11.10.2018 |
| | | 155.00 | 153.00 | -2.00 | 03.11.2018 |
| | | 153.00 | 148.00 | -5.00 | 16.11.2018 |
| | | 148.00 | 143.00 | -5.00 | 01.12.2018 |
| | | 143.00 | 133.00 | -10.00 | 22.12.2018 |
| ඩීසල් (Auto Diesel) (අ) (රුපියල්)  | සිපෙට්කෝ (ආ) | 95.00 | 109.00 | 14.00 | 11.05.2018 |
| | | 109.00 | 118.00 | 9.00 | 11.07.2018 |
| | | 118.00 | 123.00 | 5.00 | 11.09.2018 |
| | | 123.00 | 116.00 | -7.00 | 02.11.2018 |
| | | 116.00 | 111.00 | -5.00 | 16.11.2018 |
| | | 111.00 | 106.00 | -5.00 | 01.12.2018 |
| | | 106.00 | 101.00 | -5.00 | 22.12.2018 |
| | ලංකා IOC (ඇ) | 100.00 | 111.00 | 11.00 | 11.05.2018 |
| | | 111.00 | 118.00 | 7.00 | 06.07.2018 |
| | | 118.00 | 123.00 | 5.00 | 11.09.2018 |
| | | 123.00 | 129.00 | 6.00 | 11.10.2018 |
| | | 129.00 | 118.00 | -11.00 | 03.11.2018 |
| | | 118.00 | 111.00 | -7.00 | 16.11.2018 |
| | | 111.00 | 106.00 | -5.00 | 01.12.2018 |
| | | 106.00 | 101.00 | -5.00 | 22.12.2018 |
| භූමිතෙල් (අ) (රුපියල්)  | | 44.00 | 101.00 | 57.00 | 11.05.2018 |
| | | 101.00 | 70.00 | -31.00 | 13.06.2018 |
| එල්.පී. ගෑස්(ඈ) (රුපියල්)  | | 1431.00 | 1676.00 | 245.00 | 28.04.2018 |
| | | 1676.00 | 1538.00 | -138.00 | 30.06.2018 |
| | | 1538.00 | 1733.00 | 195.00 | 27.09.2018 |
| බස් ගාස්තු  | | | | 12.5% | 23.05.2018 |
| | | | | 4.0% (ඉ) | 21.09.2018 |
| | | | | -4.2% (ඉ) | 27.12.2018 |
| දුම්රිය ගාස්තු (ඉ)  | | | | 15% | 01.10.2018 |

(අ) ලීටර් එකක් සඳහා වූ මිල සංශෝධනය
(ආ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC)
(ඇ) ලංකා ඉන්දියන් ඔයිල් සමාගම (LIOC)
(ඈ) කිලෝග්‍රෑම් 12.5ක් බරැති එල්.පී. ගෑස් සිලින්ඩරයක වූ මිල සංශෝධනය සලකන ලදී.
(ඉ) අවම ගාස්තුව සංශෝධනය නොවුණි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

4

අවප්‍රමාණය වීම සැලකිල්ලට ගෙන සිදු කරන ලද මිල සංශෝධන හේතුවෙන්, 2018 වසර තුළ දී එල්.පී. ගෑස් මිල සමස්තයක් ලෙස ඉහළ යෑමක් දක්නට ලැබුණි. මේ හේතුවෙන් ආපනශාලා සහ හෝටල් උප කාණ්ඩයෙහි පිළියෙල කරන ලද ආහාර අයිතමවල මිල ඉහළ යෑමක් ද දක්නට ලැබුණි. ද්විතියික අධ්‍යාපනය සඳහා වන අමතර පංති ගාස්තුවල ඉහළ යෑමක් 2018 වසරේ මුල් කාලයේ දී දක්නට ලැබුණු අතර, රසායනාගාර ගාස්තු හා පෞද්ගලික රෝහල් කාමර ගාස්තුවල සැලකිය යුතු ඉහළ යෑමක් 2018 නොවැම්බර් මාසයේ දී දක්නට ලැබුණි. 2018 වසරේ දී රුපියල අවප්‍රමාණය වීම නිසා, රෙදිපිළි හා පාවහන් උප කාණ්ඩයේ අයිතමවල මිල පෙර වසරට සාපේක්ෂව ඉහළ යෑමක් පෙන්නුම් කළ නමුත් එම උප කාණ්ඩය සඳහා ලබා දී ඇති සුළු බර තැබීම හේතුවෙන් පාරිභෝගික මිල දර්ශකවලට එම මිල ඉහළ යෑම මගින් ඇති වූ බලපෑම අවම විය.

4

## පාරිභෝගික මිල දර්ශක

### ජාතික පාරිභෝගික මිල දර්ශකය

**2018 ජනවාරි මාසයේ දී දර්ශක අංක 125.8 ක් වූ ජා.පා.මි.ද. මිශ්‍ර විචලන පෙන්නුම් කරමින් දෙසැම්බර් මාසයේ දී දර්ශක අංක 127.1 ක් කරා ළඟා විය.** මාසික පදනම මත ගණනය කරනු ලබන ජා.පා.මි.ද., වසරේ පළමු මාස තුන තුළ දී ප්‍රධාන වශයෙන් ආහාර කාණ්ඩයෙහි අයිතමවල සිදු වූ මිල පහළ යෑම හේතුවෙන් පහළ ගිය අතර, ඉන් අනතුරුව ජූලි මාසය දක්වා ආහාර නොවන කාණ්ඩයෙහි අයිතමවල සිදු වූ මිල ඉහළ යෑම් නිසා ඉහළ යන ලදී. මේ අතර, 2018 මැයි සහ ජූනි මාසවල දක්නට ලැබුණු මාසික පදනම මත ජා.පා.මි. දර්ශකයෙහි ඉහළ යෑම කෙරෙහි ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ඉහළ යෑම ද දායක විය. අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල දී ජා.පා.මි. දර්ශකයෙහි මාසික පහළ යෑම් සඳහා ආහාර කාණ්ඩයේ අයිතමවල මිලෙහි සිදු වූ පහළ යෑම් දායක වූ අතර, ඔක්තෝබර් මාසයේ දී ජා.පා.මි. දර්ශකයෙහි මාසික ඉහළ යෑමට ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ඉහළ යෑම පමණක් දායක විය. ආහාර සහ ආහාර නොවන කාණ්ඩයන්හි අයිතමවල සිදු වූ මිල වෙනස්වීම හේතුවෙන් ජා.පා.මි.ද., නොවැම්බර් මාසයේ දී ඉහළ ගොස් දෙසැම්බර් මාසයේ දී පහළ ගියේය.

### කොළඹ පාරිභෝගික මිල දර්ශකය

**2018 වසර තුළ දී කො.පා.මි. දර්ශකය ද ජා.පා.මි. දර්ශකයට සමාන ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.** 2018 ජනවාරි මාසයේ දර්ශක අංක 122.8 ක් ලෙස වාර්තා වූ කො.පා.මි.ද. දෙසැම්බර් මාසයේ දී දර්ශක අංක 126.3 ක් දක්වා ඉහළ ගියේය. කො.පා.මි. දර්ශකයෙහි වෙනස සඳහා ආහාර කාණ්ඩයෙහි අයිතමවල මිල විචලන ප්‍රධාන වශයෙන් දායක වූ අතර, ඇතැම් මාසවල දී පමණක් ආහාර නොවන කාණ්ඩයෙහි මිල ගණන් සැලකිය යුතු ලෙස දායක විය. ආහාර කාණ්ඩයේ අයිතමවල මිලෙහි වූ මාසික පහළ යෑම් හේතුවෙන් කො.පා.මි.ද., වසරේ පළමු මාස තුන තුළ දී පහළ ගියේය. කෙසේ වුවද, එතැන් සිට 2018 අගෝස්තු මාසය දක්වා කො.පා.මි.ද. ඉහළ යෑමට ආහාර සහ ආහාර නොවන කාණ්ඩවල අයිතමවල මිල ගණන් ඉහළ යෑම් දායක වූ අතර, අප්‍රේල් සහ අගෝස්තු මාසවල කො.පා.මි. දර්ශකයෙහි විචලනය සඳහා ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ඉහළ යෑම පමණක් හේතු විය. ඉන් අනතුරුව, ආහාර කාණ්ඩයේ අයිතමවල මිල පහළ යෑම් හේතුවෙන් ඔක්තෝබර් මාසය දක්වා කො.පා.මි.ද. පහළ ගියේය. නොවැම්බර් මාසයේ කො.පා.මි. දර්ශකයෙහි සිදු වූ ඉහළ යෑමට ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ඉහළ යෑම දායක වූ අතර, දෙසැම්බර් මාසයේ සිදු වූ මිල ඉහළ යෑමට, ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ඉහළ යෑම පමණක් දායක විය.

**4.3 සංඛ්‍යා සටහන**

**මිල දර්ශකවල වෙනස්වීම්**


| දර්ශකය | දර්ශකය (වසර අග) | | වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස | | වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|
| | 2017 | 2018 (අ) | 2017 දෙසැ/ 2016 දෙසැ | 2018 දෙසැ/ 2017 දෙසැ (අ) | 2017/2016 | 2017/2018 (අ) |
| ජා.පා.මි.ද. (2013=100) | 126.6 | 127.1 | 7.3 | 0.4 | 7.7 | 2.1 |
| කො.පා.මි.ද. (2013=100) | 122.9 | 126.3 | 7.1 | 2.8 | 6.6 | 4.3 |
| නි.මි.ද. (2013-4 වැනි කාර්තුව=100) | 131.8 | 137.5 | 14.3 | 4.3 | 17.0 | 6.3 |
| ද.දේ.නි. අවධමනකය (2010=100) | 143.6 (අ)(ආ) | 149.8 | - | - | 8.2 (අ)(ආ) | 4.3 |

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**4.3 රූප සටහන**

**ජා.පා.මි.ද. සහ කො.පා.මි.ද. සඳහා වාර්ෂික සාමාන්‍ය දායකත්වය - 2018**




මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව




## මතුපිට උද්ධමනය

2018 වසර තුළ දී, ජා.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, මිශ්‍ර විචලන සහිතව සමස්තයක් වශයෙන් පහළ යන නැඹුරුවක් පෙන්නුම් කරන ලදී. ඒ අනුව, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, ජනවාරි මාසයේ දී වාර්තා වූ සියයට 5.4 හැර 2018 ඉතිරි මාසවල දී සියයට 4.0 ට අඩු මට්ටමක පැවතුණි. 2018 ඔක්තෝම්බර් මාසයේ දී මතුපිට උද්ධමනය සියයට 0.1 දක්වා පහළ ගිය අතර, එය 2016 ජනවාරි මාසයට පසු වාර්තා වූ අවම අගය වේ. මෙම අවම මතුපිට උද්ධමනය සඳහා ඉහළ පදනම් බලපෑම ප්‍රධාන වශයෙන් හේතු වූ අතර ඊට පාදක වූයේ 2017 වසරේ දී ආහාර මිල ඉහළ මට්ටමක පැවතීමයි. 2018 වසර තුළ දී ජා.පා.මි.ද. මත පදනම් වූ ආහාර

**4.4 රූප සටහන**


**ජා.පා.මි.ද. වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය - 2018**




මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**4.5 රූප සටහන**

**කො.පා.මි.ද. වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය - 2018**




මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

4

උද්ධමනය, ජා.පා.මි. දර්ශකයෙහි මතුපිට උද්ධමනයට සමාන ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. 2016 ජනවාරි මාසයට පසු වාර්තා වූ අවම ජා.පා.මි.ද. මත පදනම් වූ ආහාර උද්ධමනය 2018 ඔක්තෝබර් මාසයේ දී වාර්තා වූ අතර එය සියයට -6.6 ක් විය. කෙසේ වුවද, ජා.පා.මි.ද. මත පදනම් වූ ආහාර නොවන උද්ධමනය 2018 වසරේ පළමු මාස දහය තුළ දී ඉහළ යන නැඹුරුවක් පෙන්නුම් කරන ලද අතර ඉන් අනතුරුව පහළ ගියේය. මේ අතර, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය, 2017 වසර තුළ පෙන්නුම් කළ ඉහළ යන ප්‍රවණතාවට ප්‍රතිවිරුද්ධව යමින් 2018 ජනවාරි මාසයේ පැවති සියයට 7.6 සිට දෙසැම්බර් මාසයේ දී සියයට 2.1 දක්වා අඛණ්ඩව පහළ ගියේය.

**කො.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2018 වසරේ මුල් මාස නමය තුළ දී ඉලක්කගත සියයට 4.0-6.0 රාමුව තුළ පැවති අතර, ඉන් අනතුරුව සියයට 4.0 ට පහළින් පැවතුණි.** ජනවාරි සිට මාර්තු දක්වා නිරීක්ෂණය කළ කො.පා.මි.ද. පදනම් කරගත් මතුපිට උද්ධමනයේ පහළ යෑමට ආහාර කාණ්ඩයේ අයිතමවල මිල පහළ යෑම හේතු විය. මැයි සිට අගෝස්තු දක්වා ඉහළ යන නැඹුරුවක් අනුගමනය කළ කො.පා.මි. දර්ශකයෙහි මතුපිට උද්ධමනය, අගෝස්තු මාසයේ දී සියයට 5.9 ක් වූ වසරේ ඉහළතම අගය වාර්තා කර, ඉන් අනතුරුව දෙසැම්බර් මාසයේ දී සියයට 2.8 දක්වා ක්‍රමයෙන් පහළ ගියේය. කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය, 2018 අප්‍රේල් මාසයේ දී වූ පහළ යෑමට සහ අගෝස්තු මාසයේ දී වූ ඉහළ යෑමට පදනම් බලපෑම පමණක් දායක විය. කො.පා.මි.ද. මත පදනම් වූ ආහාර උද්ධමනය, 2018 ඔක්තෝබර් මාසයේ සියයට -2.3 ක් වූ අතර එය 2016 ජනවාරි මාසයට පසු වාර්තා වූ අවම අගය විය. කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය, 2018 ජනවාරි මාසයේ දී පැවති සියයට 6.6 සිට දෙසැම්බර් මාසයේ දී සියයට 4.3 දක්වා පහළ ගිය අතර, ජූනි සිට අගෝස්තු දක්වා මාස තුන තුළ දී සියයට 5.6 ක් ලෙස අඛණ්ඩව පැවතුණි.


**නිල මිල දර්ශකවල පාරිභෝගික භාණ්ඩ පැසෙහි අඩංගු ආනයනික අයිතමවලින් හටගන්නා උද්ධමනය, 2018 මුල් මාසවල දී පහළ ගිය අතර, ඉන්පසු එම ප්‍රවණතාව වෙනස් කරමින් ඔක්තෝබර් මාසයේ දී ඉහළම අගය වාර්තා කොට එතැන් සිට යළිත් පහළ ගියේය.** 2018 වසරේ අග භාගයේ දී දක්නට ලැබුණු මෙම පහළ යෑම සඳහා, විවිධ ආනයනික අත්‍යවශ්‍ය අයිතමවලට අදාළ වන පරිපාලිත මිල යාන්ත්‍රණය සහ දේශීය වෙළඳපොළෙහි ඉන්ධන මිල පහළ දැමීම ද දායක විය. තවද, වසර අග භාගයේ දී රුපියල ශීඝ්‍රයෙන් අවප්‍රමාණය වීම මධ්‍යයේ වුව ද, පහළ උද්ධමන මට්ටම් පවත්වා ගැනීමට බඩ් ගාස්තු සහ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පහත හෙළීම, වෙළඳපොළ තරගකාරීත්වය සහ කෘෂිකර්මාන්ත අංශය යථා තත්ත්වයට පත්වීම හිතකර ලෙස බලපාන ලදී.

## මූලික උද්ධමනය

**ආර්ථිකයේ යටිදැරි උද්ධමනය නිරූපණය කරන ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය, 2018 වසර තුළ දී අඩු මට්ටමක් පෙන්නුම් කරන ලදී.** ජා.පා.මි.ද. මත පදනම් වූ මූලික උද්ධමනය 2018 ජනවාරි මාසයේ දී වාර්තා කළ සියයට 2.1 සිට මැයි මාසයේ දී සියයට 1.7 ක් දක්වා ක්‍රමයෙන් පහළ ගියේය. කෙසේ වුවද, එය ඉන් අනතුරුව ඉහළ ගිය

**4.6 රූප සටහන**


**මූලික උද්ධමනයෙහි විචලන (වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**4.7 රූප සටහන**

**නිෂ්පාදක මිල උද්ධමනයෙහි විචලන (වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

අතර ඔක්තෝබර් මාසයේ දී සියයට 3.4 ක ඉහළම අගය වාර්තා කොට නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල දී සියයට 3.1 ක් දක්වා නැවත පහළ ගියේය. ජූනි සිට සැප්තැම්බර් දක්වා මාසවල දී පෙන්නුම් කළ ඉහළ යැමට ආහාර සහ ආහාර නොවන කාණ්ඩවල අයිතමවල මිල ඉහළ යැම හේතු වූ අතර, ඔක්තෝබර් මාසයේ දක්නට ලැබුණු ඉහළ යැම සඳහා ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ඉහළ යැම පමණක් හේතු විය. මේ අතර, කො.පා.මි.ද. මත පදනම් වූ මූලික උද්ධමනය, 2018 ජනවාරි මාසයේ දී වාර්තා වූ සියයට 3.5 සිට ජූලි මාසයේ දී සියයට 3.9 දක්වා ඉහළ ගොස්, දෙසැම්බර් මාසයේ දී සියයට 3.1 දක්වා අඩු විය. කො.පා.මි. දර්ශකයෙහි භාණ්ඩ පැස තුළ ආහාර නොවන කාණ්ඩය සඳහා වැඩි බර තැබීමක් ඇති බැවින් කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනයේ විචලනය, ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ප්‍රවණතාවලට අනුකූලව සිදු විය.

## නිෂ්පාදක මිල උද්ධමනය

**2018 වසරේ දී නිෂ්පාදකයාගේ මිල දර්ශකයෙහි (නි.මි.ද., 2013 සිව්වන කාර්තුව=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන නිෂ්පාදක මිල උද්ධමනය, මිශ්‍ර විචලන සහිතව සමස්තයක් ලෙස පහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.** කෘෂිකර්මාන්ත උප අංශයේ වාර්ෂික ලක්ෂ්‍යමය නිෂ්පාදක මිල උද්ධමනය, 2018 ඔක්තෝබර් මාසය දක්වා පහළ ගිය අතර ඉන් අනතුරුව ඉහළ යන ලදී. නිෂ්පාදන උප අංශයේ නිෂ්පාදක මිල උද්ධමනය 2018 වසරේ දී මිශ්‍ර විචලන සහිතව සමස්තයක් ලෙස ඉහළ යන ලදී. කෙසේ වුවද, විදුලිය සහ ජල සැපයුම් උප අංශයේ නිෂ්පාදක මිල උද්ධමනය 2018 වසරේ දී ස්ථාවරව පැවතුණි.

**4.4 සංඛ්‍යා සටහන**

**දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය**

(2010=100)

| අංශය | දර්ශකය | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|
| | 2016 (අ) | 2017 (අ)(ආ) | 2018 (ආ) | 2017/2016 (අ)(ආ) | 2018/2017 (ආ) |
| කෘෂිකර්මාන්ත | 138.2 | 162.6 | 169.0 | 17.6 | 4.0 |
| කර්මාන්ත | 139.2 | 146.7 | 154.8 | 5.4 | 5.5 |
| සේවා | 132.1 | 140.7 | 147.7 | 6.6 | 4.9 |
| **ද.දේ.නි.** | **132.8** | **143.6** | **149.8** | **8.2** | **4.3** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය

**ආර්ථිකයේ දේශීයව නිපදවන සියලුම භාණ්ඩ සහ සේවාවල සමස්ත මිල වෙනස් වීම මනිනු ලබන දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය, පසුගිය වසරට සාපේක්ෂව 2018 වසර තුළ දී පහළ ගිය අතර, කෘෂිකර්මාන්ත සහ සේවා ක්‍රියාකාරකම්වල අඩු මිල විචලන පැවතීම මීට ප්‍රධාන වශයෙන් හේතු විය.** ඒ අනුව, සමස්ත දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය, 2017 වසරේ වාර්තා කළ සියයට 8.2 සිට 2018 වසරේ දී සියයට 4.3 දක්වා අඩු විය. කෘෂිකර්මාන්ත අංශයේ අවධමනකය 2017 වසරේ වූ සියයට 17.6 සිට 2018 වසරේ දී සියයට 4.0 දක්වා කැපී පෙනෙන අඩුවීමක් පෙන්නුම් කළ අතර සේවා අංශයේ අවධමනකය එම කාලපරිච්ඡේදයේ දී සියයට 6.6 සිට සියයට 4.9 දක්වා පහළ ගියේය. කෙසේ වුවද, කර්මාන්ත අංශයේ අවධමනකය 2017 වසරේ වාර්තා කළ සියයට 5.4 සිට 2018 වසරේ දී සියයට 5.5 දක්වා සුළු වර්ධනයක් පෙන්නුම් කළේය.

## උද්ධමන අපේක්ෂා

**ව්‍යාපාර අංශයේ උද්ධමන අපේක්ෂා 2018 වසරේ දී පහළ ගිය අතර සැබෑ උද්ධමනයට බොහෝ සෙයින් අනුරූපව හැසිරිණි.** කෙසේ වුවද, ව්‍යාපාර අංශය දිගුකාලීන උද්ධමනයේ ඉහළ යැමක් අපේක්ෂා කිරීම හේතුවෙන්, පෙර වසරට සාපේක්ෂව 2018 වසරේ දී කෙටිකාලීන හා දිගුකාලීන උද්ධමන අපේක්ෂා අතර පරතරයේ වැඩිවීමක් දක්නට ලැබුණි. අපේක්ෂිත දිගුකාලීන උද්ධමන මට්ටම සඳහා ප්‍රධාන හේතු වශයෙන් දේශීය ව්‍යවහාර මුදලේ විදේශීය අගය අවප්‍රමාණය වීම, සැපයුම් අංශයේ සිදු වූ අඩාල වීම්, ආර්ථික අස්ථාවරත්වය සහ වර්ධනයේ පසුබෑම් යනාදිය ප්‍රතිචාර දැක්වූවන් විසින් සඳහන් කරන ලදී. ව්‍යාපාර අංශයේ උද්ධමන අපේක්ෂා කාල පමාවක් සහිතව වුවද, මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට අනුරූපව ප්‍රතිචාර දක්වා ඇත. කුටුම්බ අංශයේ

4

### විශේෂ සටහන 5

## දේපළ මිල දර්ශක සම්පාදනය: ශ්‍රී ලංකාවේ සභාධිපත්‍ය වෙළඳපොළ සඳහා ප්‍රවේශයක්

නිවාස මිල උද්ධමනය මැනීම සඳහා අන්තර්ජාතික වශයෙන් සංසන්දනය කළ හැකි දේපළ මිල දර්ශකවල අවශ්‍යතාවය මෑත කාලීනව දැඩිව උද්ගත විය. එක්සත් ජනපදයේ දේපළ වෙළඳාම් ක්ෂේත්‍රය ආශ්‍රිතව සිදු වූ බිඳ වැටීම ප්‍රධාන හේතුවක් වෙමින් 2008 වසරේ දී ඇති වූ ගෝලීය මූල්‍ය අර්බුදයත් ඉන් අනතුරුව ඇති වූ ආර්ථික පසුබෑමත් ඉහත අවශ්‍යතාවය මතු වීම කෙරෙහි පාදක විය. ප්‍රතිපත්ති සම්පාදකයන්ට ආර්ථිකයේ හැසිරීම පිළිබඳව නිසි ඇගැයීමක් සිදුකර උචිත ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය වන්නා වූ ආර්ථික හා මූල්‍ය දත්තවල හිඟයක් පවතින බව, පශ්චාත් මූල්‍ය අර්බුද විමර්ශන මගින් හඳුනාගත් ප්‍රධාන කරුණක් විය. මෙම දත්ත හිඟය අවම කරගැනීම සඳහා ගතහැකි එක් පියවරක් ලෙස නේවාසික හා වාණිජ යන දෙඅංශයටම අදාළව දේපළ මිල දර්ශක සම්පාදනය කිරීම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (International Monetary Fund - IMF) සහ මූල්‍ය ස්ථායි මණ්ඩලය (Financial Stability Board - FSB) විසින් ගෙන එන ලද යෝජනා[1] අතර විය. මෙම යෝජනාව G20 රටවල් විසින් අනුමත කරන ලද අතර, අනෙකුත් බොහෝ රටවල් දේපළ මිල දර්ශක සම්පාදනය කිරීමේ ක්‍රම පිළිබඳව ගවේෂණය කිරීමට ද ඉන් පෙළඹවීමක් ඇති විය.

නිවාස මිලදී ගැනීම සඳහා දැරිය හැකි පිරිවැය මෙන්ම නිවාස මිලෙහි සිදුවන විචලන හේතුවෙන් පාරිභෝගික වියදම් රටාවෙහි ඇතිවන වෙනස්වීම් ආර්ථිකයේ මිල ස්ථායිතාවයට බලපෑමක් ඇති කරන බැවින්, නිවාස මිල විචලනය අධීක්ෂණය කිරීම වැදගත් වේ. තවද, නිශ්චල දේපළ ක්ෂේත්‍රයට අදාළ ක්‍රියාකාරකම් ආර්ථික වර්ධනයට විශාල දායකත්වයක් සපයන බැවින්, මෙම ක්ෂේත්‍රය තුළ සිදුවන සැලකිය යුතු වෙනස්කම් සමස්ත ආර්ථික වර්ධනයේ විචලනයට ද හේතු වේ. මූල්‍ය ආයතන විසින් නිශ්චල දේපළ අංශය සඳහා අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන, ණය සහ අත්තිකාරම් වශයෙන් ලබාදෙන බැවින්, මූල්‍ය වෙළඳපොළ කෙරෙහි ද නිවාස මිල වෙනස්වීම් විශාල බලපෑමක් ඇති කරයි. එබැවින්, ඉහළ ගුණාත්මකභාවයකින් යුතු, කාල පමාවකින් තොර දේපළ මිල දර්ශක, ආර්ථික වර්ධනය මෙන්ම මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවය සහ ශක්තිමත්භාවය මැනීම සඳහා පූර්ව දර්ශක ලෙස භාවිතා කළ හැකිය. මේ අනුව, දේපළ මිල දර්ශක, මුදල් සහ මූල්‍ය ප්‍රතිපත්ති සැකසීමේ ක්‍රියාවලියේ දී සලකා බැලිය යුතු අත්‍යවශ්‍ය අංගයක් බවට ද පත් වී තිබේ. මීට අමතරව, දේපළ වෙළඳාම් තුළින් අනාගතයේ දී ඉහළ ප්‍රතිලාභ ලැබෙතැයි අපේක්ෂා කිරීම මගින් විදේශ ආයෝජන ද ආර්ථිකය වෙත ආකර්ෂණය වනු ඇත. අනාගත ආයෝජකයන්ට දේශීය දේපළ වෙළඳපොළ තත්ත්වයන් වෙනත් විකල්ප ආයෝජන සමඟ මෙන්ම ජාත්‍යන්තර දේපළ වෙළඳපොළ සමඟ සැසඳීම සඳහා ද විශ්වසනීය සහ සංසන්දනාත්මක දේපළ මිල දර්ශක පැවතීම බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත.

දේපළ මිල දර්ශක පිළිබඳ සංකල්පය බොහෝ රටවල් සඳහා සාපේක්ෂ වශයෙන් නව සංසිද්ධියක් වුවද, ඇතැම් රටවල් දීර්ඝ කාලයක් තිස්සේ මෙම දර්ශක සම්පාදනය කරනු ලබයි. කෙසේ වෙතත්, දේපළවල විෂමජාතීය බව, එනම්, දේපළ ඒකක දෙකක් එකිනෙකට සමාන නොවීම සහ කාලයාගේ ඇවෑමෙන් දේපළවල තත්ත්වයෙහි සිදුවන වෙනස්කම් (අවට ප්‍රදේශයේ යටිතල පහසුකම්වල සිදුවන වෙනස්කම්, තාක්ෂණික දියුණුව සමඟ නිවාස ඒකක තුළ පවත්නා පහසුකම් යල්පැන යෑම ආදිය පාදක කොටගෙන) හේතුවෙන්, දේපළ මිල ගණන්වල සිදුවන කාලීන උච්චාවචන අධීක්ෂණය කිරීමට හැකිවන පරිදි දර්ශකයක් සම්පාදනය කිරීම අභියෝගාත්මක කටයුත්තකි. එමෙන්ම, දේපළ හුවමාරු කරගැනීම්වලට අදාළ ගනුදෙනු නිරන්තරයෙන් සිදු නොවන බැවින්, යම්කිසි වෙළඳපොළක් තුළ නිශ්චිත කාලසීමාවකට අදාළව සෘජුවම සංසන්දනය කළ හැකිවන ආකාරයේ විකුණුම් පවතින්නේ සුළු ප්‍රමාණයක් පමණි. මෙම හේතුන් නිසා දේපළ මිල දර්ශක සම්පාදනයේ දී ගුණාත්මක සැකැසීම් (quality adjustments) සිදුකිරීම අනිවාර්ය වේ. මෙම ගැටලු පිළිබඳව සිදුකරන ලද පර්යේෂණ ගණනාවකින් අනතුරුව, විද්වතුන්ගෙන් සහ වෘත්තිකයන්ගෙන් සමන්විත විශේෂඥ කණ්ඩායමක් විසින් මිල දර්ශක පිළිබඳව ජාත්‍යන්තර අත්පොත්[2] හඳුන්වා දී තිබේ. ඒවායේ 'ස්ථරීකරණය හෝ මිශ්‍ර සකස් කිරීමේ ක්‍රමය (Stratification or Mixed Adjustment method)', 'හෙඩොනික් ප්‍රතිපායන ක්‍රමය (Hedonic Regression method)', 'පුනරාවර්තන විකුණුම් ක්‍රමය (Repeat Sales method)' සහ 'ඇගැයීම් පාදක ක්‍රමය (Appraisal - Based method)' වශයෙන් දේපළ මිල දර්ශක ඇස්තමේන්තු කිරීමේ දී ගුණාත්මක සැකසීම් සිදුකිරීම සඳහා උපයෝගී කරගනු ලබන ප්‍රධාන ක්‍රම හතරක් අන්තර්ගත කර ඇත. මෙම ක්‍රම ලොව පුරා රටවල් මගින් දේපළ මිල දර්ශක ගණනය කිරීමේ දී භාවිතා කරනු ලබයි. මේ අතරින් විස්තරාත්මක තොරතුරු සහිත දත්ත මූලාශ්‍රයක් පවතින අවස්ථාවල දී විශ්වසනීය දර්ශකයක් සකස් කිරීම සඳහා වඩාත්ම සුදුසු ක්‍රමය ලෙස 'හෙඩොනික් ප්‍රතිපායන ක්‍රමය' නිර්දේශ කර තිබේ.

1 හඳුනාගත් දත්ත අඩුපාඩු සකස් කිරීම සඳහා ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ 20 ක් (G20 Data Gap Initiatives - Phase I and II) ඇතුළත් කරමින් සකස් කළ වාර්තාවක් 2009 ඔක්තෝබර් මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ මූල්‍ය ස්ථායි මණ්ඩලය විසින් G20 රටවල මුදල් අමාත්‍යවරුන්ට සහ මහ බැංකු අධිපතිවරුන්ට ඉදිරිපත් කරන ලදී.

2 නිවාස මිල දර්ශක සම්පාදනය පිළිබඳ ප්‍රායෝගික මඟ පෙන්වීම් ලබා දෙමින් රටවල්වල නේවාසික දේපළ මිල දර්ශක සම්පාදනය සඳහා සහාය දැක්වීමේ අරමුණින් යුතුව යුරෝස්ටැට් (Eurostat) මගින් 2013 වර්ෂයේ දී නිකුත් කරන ලද 'Handbook on Residential Property Price Indices (RPPIs)' සහ වාණිජ දේපළ මිල දර්ශකවලට අදාළ දත්ත මූලාශ්‍ර සහ ක්‍රමවේද ඇතුළත් කරමින් 2017 වසරේ දී යුරෝස්ටැට් මගින් නිකුත් කරන ලද, 'Commercial Property Price Indicators: Sources, Methods and Issues' යනාදිය මෙයට ඇතුළත් වේ.

### ශ්‍රී ලංකාව සඳහා දේපළ මිල දර්ශක

දේපළ වෙළඳපොළ ක්ෂේත්‍රය වර්තමානයේ දී ශ්‍රී ලංකා ආර්ථිකයෙහි ද වැදගත් අංගයක් වී තිබේ. මෑත කාලීනව එම ක්ෂේත්‍රය තුළ, විශේෂයෙන් සහාධිපත්‍ය දේපළ වෙළඳපොළ ආශ්‍රිතව, සිදු වූ පුළුල් විකාශනය මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, ගෝලීය පරිචයන්ට අනුකූලව මෙම නව වෙළඳපොළ ප්‍රවණතා ආවරණය වන පරිදි තම අධීක්ෂණ පථය පුළුල් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 1998 වර්ෂයේ සිට ගණනය කරනු ලබන ඉඩම් මිල දර්ශකයට[3] අමතරව, සහාධිපත්‍ය දේපළ අංශය කෙරෙහි ද අවධානය යොමු කරමින් නේවාසික දේපළ මිල දර්ශකයක් සැකසීම 2016 වසරේ දී ආරම්භ කරන ලදී. එහිදී, ස්වයංක්‍රීයකරණය වූ පද්ධතිවල හිඟකම හේතුවෙන් යම්කිසි කාලපරිච්ඡේදයක් තුළ දී සිදු වූ නිල විකුණුම් ගනුදෙනු පිළිබඳ නිශ්චිත වාර්තා කාලීනව ලබාගැනීමේ අපහසුතා පැවැතීම සහ ඒවායේ විස්තරාත්මක දත්ත නොමැති වීම යන කරුණු හේතුවෙන් විකල්ප දත්ත මූලාශ්‍ර භාවිතා කිරීම කෙරෙහි අවධානය යොමු විය. ඒ අනුව, පළමුව දේපළ වෙළඳ දැන්වීම්වල සඳහන් මිල ගණන් උපයෝගී කොටගෙන සහාධිපත්‍ය මිල දර්ශකයක් මාසිකව සම්පාදනය කිරීම ආරම්භ කරන ලදී. එසේ වුවද, සැබෑ විකුණුම් මිල ගණන් දැන්වීම්වල සඳහන් මිල ගණන්වලට වඩා අඩු අගයන් විය හැකි අතර පළ කරන ලද දැන්වීම්වලට අදාළ සියලු සහාධිපත්‍යය ඒකක එම කාලය තුළ විකුණා නොමැති වීමට ද ඉඩ ඇත. එමෙන්ම, මෙම ක්‍රමවේදය යටතේ මිල විචලන සඳහා හේතු වූ කරුණු හඳුනා ගැනීමට හෝ අදාළ වෙළඳපොළ පිළිබඳ වැඩිදුර තොරතුරු ලබා ගැනීමට හෝ හැකියාවක් නොමැත. මෙවැනි ගැටලුවලට විසඳුමක් ලෙස සහාධිපත්‍ය වෙළඳපොළ පිළිබඳ සමීක්ෂණයක් ආරම්භ කිරීමට තීරණය කරන ලදී. එම සමීක්ෂණය මගින් මිල දර්ශකයක් සම්පාදනය කිරීම සඳහා සැබෑ විකුණුම් පිළිබඳ තොරතුරු එක්රැස් කර ගැනීමට පමණක් නොව වෙළඳපොළ පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා ගැනීමට ද හැකි වේ.

### සහාධිපත්‍ය වෙළඳපොළ පිළිබඳ සමීක්ෂණය

විකුණුම් මිල ගණන් සහ අනෙකුත් තොරතුරු කාර්තුමය පදනම මත ලබාගැනීමේ අරමුණින්, 2017 වර්ෂයේ තුන්වන කාර්තුවේ දී සහාධිපත්‍ය වෙළඳපොළ පිළිබඳ සමීක්ෂණය දියත් කරන ලදී. මෙම සමීක්ෂණයේ ප්‍රතිචාර දක්වන්නන් වනුයේ, ශ්‍රී ලංකා සහාධිපත්‍ය ඉදිකරන්නන්ගේ සංගමයේ (Condominium Developers Association of Sri Lanka - CDASL) සාමාජිකයන් සහ වෙළඳපොළේ අනෙකුත් සහාධිපත්‍ය ඉදිකරන්නන්ය. සමීක්ෂණයට ප්‍රතිචාර දක්වන්නන් අතර බෙදා හරිනු ලබන ප්‍රශ්නාවලියක් මගින් වෙළඳපොළ තොරතුරු ලබා ගැනීම සිදු කෙරේ.

### සහාධිපත්‍ය වෙළඳපොළ මිල දර්ශකය සම්පාදනය කිරීම

සහාධිපත්‍ය ඒකකවල පවතින වෙනස්කම් හේතුවෙන් ශ්‍රී ලංකාව සඳහා සහාධිපත්‍ය මිල දර්ශකයක් සම්පාදනය කිරීමේ දී ගුණාත්මක සැකසීම් සිදුකිරීම සඳහා 'හෙඩොනික් ප්‍රතිපායන ක්‍රමය' භාවිතා කිරීමට තීරණය කරන ලදී. මෙම ක්‍රමය යටතේ, නිවාස ඒකකයක් එහි ලාක්ෂණික ගුණවල එකතුවක් ලෙස සලකනු ලැබීම මීට හේතු විය. ප්‍රතිපායන සමීකරණයට අවශ්‍ය විචල්‍ය ලෙස යොදා ගැනීම සඳහා සුදුසු මිල තීරණය කිරීමේ සාධක හඳුනා ගැනීම මෙම ක්‍රමයේ දී අනුගමනය කළ යුතු වැදගත් පියවරකි. සමීක්ෂණය සඳහා ලැබුණු ප්‍රතිචාර, අනෙකුත් රටවල අත්දැකීම් සහ එක් එක් සාධකයෙහි මැනිය හැකි බව යනාදී කරුණු මත පදනම්ව පහත සඳහන් විචල්‍ය අට, ප්‍රතිපායනය සඳහා තෝරා ගන්නා ලදී.

**රූප සටහන වි.ස. 5.1**
**දර්ශකය සම්පාදනය සඳහා භාවිතා කරන විචල්‍ය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

එක් එක් කාලපරිච්ඡේදය සඳහා සහාධිපත්‍ය මිල දර්ශකය සම්පාදනය කරන ලද්දේ, මෙම ප්‍රතිපායන භාවිතයෙන් ව්‍යුත්පන්න කරන ලද නියෝජනාත්මක මිල ගණන් (representative prices) උපයෝගී කරගනිමිනි. මෙම දර්ශකය තවමත් එහි මූලික අදියරෙහි පවතින බැවින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන අභ්‍යන්තර ආර්ථික විශ්ලේෂණ සඳහා පමණක් දැනට භාවිත කරනු ලබන අතර මහජනතාවගේ පරිශීලනය සඳහා නිකුත් කර නොමැත.

### සහාධිපත්‍ය වෙළඳපොළ පිළිබඳ සමීක්ෂණය හරහා ලබා ගත් වෙළඳපොළ තොරතුරු

සහාධිපත්‍ය දේපළ ඉදිකරන්නන් විසින් සපයන ලද තොරතුරු වලට අනුව, 2018 වසරේ පළමුවන

3 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1998 සිට 2008 දක්වා වාර්ෂිකව ද, 2009 සිට 2017 දක්වා අර්ධ වාර්ෂිකව ද, කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5 ක් ආවරණය වන පරිදි රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් නේවාසික, වාණිජ සහ කාර්මික ඉඩම්වලට අදාළ පර්චසයක් සඳහා වූ මිල ගණන් භාවිතා කරමින් ඉඩම් මිල දර්ශකය ගණනය කරනු ලැබීය. දේපළ වෙළඳාම් ක්ෂේත්‍රයේ මෑත කාලීනව සිදු වූ වර්ධනය හේතුවෙන් ඉඩම් මිල ගණන් අධීක්ෂණය කිරීමේ වැදගත්කම ඉහළ යෑමත් සමඟ කොළඹ දිස්ත්‍රික්කයේ සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ඇතුළත් වන පරිදි ඉඩම් මිල දර්ශකයෙහි භූගෝලීය ආවරණය පසුව පුළුල් කරන ලද අතර පාදක වර්ෂය 2017 පළමු භාගය ලෙස සංශෝධනය කරන ලදී.

කාර්තුව[4] හැර අනෙකුත් සියලුම කාර්තුවල දී අලෙවි වූ නිවාස ඒකක සංඛ්‍යාව ස්ථාවර මට්ටමක පැවතුණි. සලකනු ලැබූ කාලපරිච්ඡේදය තුළ දී අලෙවි වූ නිවාස ඒකකවල විකුණුම් ගනුදෙනුවල සංයුතිය විශ්ලේෂණය කිරීමේ දී, රුපියල් මිලියන 25 ට අඩු නිවාස ඒකක කාණ්ඩයේ ප්‍රතිශතය වැඩිවීමක් ද අනෙකුත් කාණ්ඩවලට අදාළ ඒකකවල ප්‍රතිශතවල අඩුවීමක් ද දක්නට ලැබුණි. වාර්තා වූ විකුණුම්වලට අනුව, සහාධිපත්‍ය ව්‍යාපෘතියේ මාදිලිය[5] සහ පිහිටි ස්ථානය අනුව වර්ග කළ විට විකුණුම් ගනුදෙනු වලින් බහුතරයක් කොළඹ දිස්ත්‍රික්කය තුළ සංකේන්ද්‍රණය වී ඇති අතර ඒවායින් වැඩි ප්‍රමාණයක් කේවල සහාධිපත්‍ය ව්‍යාපෘතිවලට අයත් ඒකක විය.


### සංඛ්‍යා සටහන වි.ස. 5.1
### 2018 වසරේ සිව්වන කාර්තුව තුළ වාර්තා වූ විකුණුම් ගනුදෙනු සහ සාමාන්‍ය මිල

| ව්‍යාපෘතියේ මාදිලිය | වාර්තා වූ විකුණුම් ගනුදෙනු ප්‍රමාණය | ඒකකයක සාමාන්‍ය මිල (රු. මිලියන) |
|---|---|---|
| මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති (අ) | 21 | 71.46 |
| කොළඹ දිස්ත්‍රික්කය තුළ පවතින කේවල සහාධිපත්‍ය ව්‍යාපෘති | 199 | 25.24 |
| බස්නාහිර පළාතේ පවතින කේවල සහාධිපත්‍ය ව්‍යාපෘති (කොළඹ දිස්ත්‍රික්කය හැර) | 17 | 8.24 |
| අනෙකුත් පළාත්වල පවතින කේවල සහාධිපත්‍ය ව්‍යාපෘති | 2 | 22.15 |

(අ) සමීක්ෂණය සඳහා වාර්තා වූ සියලුම මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටා තිබේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### රූප සටහන වි.ස. 5.2
### විකුණුම් ගනුදෙනුවල සංයුතිය (අ)




(අ) මෙහි සඳහන් ප්‍රතිශත අගයන් සහධිපත්‍ය වෙළෙඳපොල පිළිබඳ සමීක්ෂණයට වාර්තා වූ විකුණුම් ගනුදෙනු මත පදනම් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


---

4 2018 පළමු කාර්තුවේ දී සහාධිපත්‍ය විකුණුම් ගනුදෙනු ප්‍රමාණය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර 2018 වසරේ අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සහාධිපත්‍ය විකුණුම් සඳහා සියයට 15 ක එකතු කළ අගය මත බදු (VAT) පැනවීමට ගෙන එන ලද අයවැය යෝජනාව මීට හේතු විය. පසුව එම යෝජනාව ක්‍රියාත්මක කිරීම වසරකින් කල් දමන ලදී.

5 සහාධිපත්‍ය වර්ගීකරණය කිරීම සඳහා සම්මත/පිළිගත් ක්‍රමවේදයක් නොමැති බැවින්, සමීක්ෂණයට ප්‍රතිචාර දක්වන ලද සහාධිපත්‍ය ව්‍යාපෘතිවල ස්වභාවය අනුව මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති සහ කේවල සහාධිපත්‍ය ව්‍යාපෘති ලෙස වර්ග දෙකකට වර්ගීකරණය කර ඇත. මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති, නේවාසික අවකාශවලට අමතරව හෝටල්, කාර්යාල අවකාශ, විනෝදාස්වාද පහසුකම් යනාදියෙන් ද සමන්විත වන අතර කේවල සහාධිපත්‍ය ව්‍යාපෘති නේවාසික අවකාශවලින් පමණක් සමන්විත වේ.

නවතම සමීක්ෂණයට සහභාගි වූ සහාධිපත්‍ය ඉදිකරන්නන් 26 දෙනා විසින් ලබාදුන් තොරතුරුවලට අනුව, 2018 වසර අවසන් වනවිට ගොඩනැගීම් කටයුතු නිම වූ සහාධිපත්‍ය ඒකක සංඛ්‍යාව 7,659 ක් වූ අතර, ඉදිකෙරෙමින් පවතින ඒකක සංඛ්‍යාව සහ සැලසුම්ගත ඒකක සංඛ්‍යාව පිළිවෙළින් 9,564 සහ 6,332 ක් විය. 2018 වර්ෂය අවසාන වන විට සම්පූර්ණ කරන ලද ව්‍යාපෘතිවල ඒකක වලින් සියයට 95 ක් අලෙවි වී තිබූ අතර, ඉදිකෙරෙමින් පවතින ව්‍යාපෘති සැලකීමේ දී මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිවල ඒකක වලින් සියයට 48 ක් ද කේවල සහාධිපත්‍ය ව්‍යාපෘතිවල ඒකක වලින් සියයට 53 ක් ද ගැනුම්කරුවන් විසින් වෙන්කරවාගෙන තිබුණි.


### රූප සටහන වි.ස. 5.3
### සම්පූර්ණ කරන ලද සහාධිපත්‍ය ව්‍යාපෘතිවල ඒකක අලෙවි වී ඇති ප්‍රතිශතය (අ)




(අ) දැනට ඉදිකිරීම් කටයුතු නිමවී ඇති සියලුම සහාධිපත්‍ය ව්‍යාපෘති කේවල ව්‍යාපෘති කාණ්ඩයට අයත්වන අතර මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු තවමත් සම්පූර්ණ කර නොමැත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### රූප සටහන වි.ස. 5.4
### දැනට ඉදිකෙරෙමින් පවතින සහාධිපත්‍ය ව්‍යාපෘතිවල වෙන්කරවාගෙන ඇති ඒකක ප්‍රතිශත




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සහාධිපත්‍ය ඉදිකරන්නන්ගේ අදහස්වලට අනුව, ප්‍රධාන වශයෙන්ම බැංකු ණය, පෙර ගෙවුම් තැන්පතු (pre-sale deposits) සහ ප්‍රාග්ධන යෙදවීම් මගින් ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය අරමුදල් සපයාගෙන තිබුණි. මීට අමතරව, සහාධිපත්‍ය මිලදී ගනු ලැබූවන්ගෙන් බහුතරය ශ්‍රී ලාංකිකයන් වන අතර, බොහෝ දෙනා ආයෝජන අරමුණට වඩා වාසය කිරීමේ අරමුණින් සහාධිපත්‍ය ඒකක මිල දී ගෙන ඇත. එම ගැනුම් කරුවන්ගෙන් බහුතරයක් තමා සතු මුදල් භාවිතයෙන් සහාධිපත්‍ය ඒකක මිලදී ගෙන තිබේ.

**ඉදිරි දැක්ම**

දත්ත රැස්කිරීමේ ගැටලු පැවතිය ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවතින දත්ත මූලාශ්‍රවල භූගෝලීය ආවරණය පුළුල් කර ගැනීම සහ ප්‍රතිචාර දැක්වීමේ ප්‍රතිශතය ඉහළ නංවාගැනීම සඳහා අඛණ්ඩව කටයුතු කරනු ලබයි. මෙමගින් දර්ශකයේ සහ වෙළඳපොළ පිළිබඳ අනෙකුත් තොරතුරුවල නියෝජනාත්මකභාවය වර්ධනය කර ගැනීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම, විසල් දත්ත (Big Data) සංකල්පය භාවිතා කරමින් නව දත්ත මූලාශ්‍ර හඳුනාගැනීමට සහ ක්ෂේත්‍රයට අදාළ පාර්ශ්වයන් සමග සමීපව කටයුතු කිරීමටත් පියවර ගෙන ඇත. මේ සමගම දේපළ මිල දර්ශක සම්පාදනය කිරීමේ දී ඇතිවන ගැටලු නිරාකරණය කිරීම පිළිබඳ අත්දැකීම් හුවමාරු කරගැනීමේ අරමුණින්, එම විෂයපථයට අදාළ විශේෂිත පුහුණුවීම්, සංසද, සම්මන්ත්‍රණ සහ පර්යේෂණ සමුළු ආදියට සහභාගි වෙමින් ශ්‍රී ලංකා මහ බැංකුව, නිරන්තරයෙන් ජාත්‍යන්තර පාර්ශ්ව සමග ද සම්බන්ධ වී කටයුතු කරනු ලබයි. තවද, දර්ශක සම්පාදන ක්‍රමවේදය වැඩිදියුණු කරගැනීම සඳහා විෂය ප්‍රවීණයන්ගෙන් තාක්ෂණික දැනුම ලබා ගැනීමට ද පියවර ගෙන තිබේ. එමගින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය පිළිබඳව පූර්ව දර්ශකයක් ලෙස දේපළ වෙළඳපොළ තත්ත්වයන් උපයෝගී කරගනිමින්, තොරතුරු මත පදනම් වූ ප්‍රතිපත්ති සැකැසීමේ ක්‍රියාවලිය වඩා ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ. මෙම වැඩිදියුණු කිරීම් වලින් සහ ප්‍රමාණවත් දත්ත කාල ශ්‍රේණියක් සම්පාදනය කිරීමෙන් අනතුරුව මෙම දර්ශකය මහජනතාවගේ පරිශීලනය සඳහා ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරනු ඇත.

උද්ධමන අපේක්ෂා, ස්වභාවයෙන්ම ගත් කළ, ව්‍යාපාර අංශයේ උද්ධමන අපේක්ෂාවලට වඩා ඉහළ මට්ටමක පැවතිය ද, එහි පහළ යන නැඹුරුවක් 2018 වසරේ දී දක්නට ලැබුණි.

## 4.3 වැටුප්

**උද්ධමනයෙහි පහළ යෑමත් සමග 2018 වසර තුළ දී වැටුප් ප්‍රමාණ දර්ශක මගින් ආර්ථිකයෙහි සුළු වැටුප් පීඩනයක ලක්ෂණ පෙන්නුම් කරන ලදී.** 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ දී නාමික වැටුප්වල සුළු වර්ධනයක් පමණක් සිදු වීම හේතුවෙන්, රාජ්‍ය සහ විධිමත් පෞද්ගලික අංශවල මූර්ත වැටුප්වල පහළ යෑම කැපී පෙනුණි. ඒ අනුව, වසර තුළ දී පොදු මිල මට්ටම මත වැටුප් මගින් ඇති වන ඉල්ලුම් පීඩනය අඩු මට්ටමක පැවතුණි.

### රාජ්‍ය අංශයේ වැටුප්

**2018 වසරේ දී, රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මූලික වැටුපට විශේෂ දීමනාව සහ අතුරු දීමනාව අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව තෙවන වසරටත් ක්‍රියාත්මක විය.** ඒ අනුව, රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයෙහි (2012=100) වාර්ෂික සාමාන්‍ය වෙනස මගින් මනිනු ලබන රාජ්‍ය අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්, 2018 වසරේ දී සියයට 0.1 කින් සුළු වශයෙන් ඉහළ ගියේය. 2017 වසරේ දී සිදු වූ සියයට 7.2 ක මූර්ත වැටුප් පහළ යෑමට සාපේක්ෂව 2018 වසරේ දී රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් සියයට 2.0 කින් පහළ ගිය අතර, ඒ සඳහා වසර තුළ පැවති පහළ උද්ධමන මට්ටම හේතු විය. කෙසේ වුවද, රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 03/2016 අනුව, රාජ්‍ය අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්හි පසුගිය වසර තුන තුළ දක්නට ලැබුණු ඉහළ යෑමට වඩා, ඉදිරි වසර දෙක තුළ ඉහළ යෑම වැඩිවනු ඇත. මීට අමතරව, 2018 අගෝස්තු මාසයේ දී, රාජ්‍ය අංශයේ වැටුප් විෂමතා විසඳීමට සාමාජිකයන් පහළොස් දෙනෙකුගෙන් සමන්විත විශේෂ වැටුප් කමිටුවක් ද පත් කරන ලදී.


### පෞද්ගලික අංශයේ වැටුප්

**පඩි පාලක සභා[3] මගින් වැටුප් පාලනය වන සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකයෙහි (1978 දෙසැම්බර්=100) වාර්ෂික සාමාන්‍ය වෙනස මගින් මනිනු ලබන විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්, 2018 වසරේ දී සියයට 0.6 කින් සුළු වශයෙන් ඉහළ ගියේය.** මුද්‍රණ, රෙදිපිළි, ටයර් සහ ටියුබ් නිෂ්පාදනය සහ ඇඟලුම් නිෂ්පාදනය යන

3 නාමික දර්ශකය ගණනය කිරීමේ දී පඩි පාලක සභා 21 ක අවම වැටුප් සලකා බලන අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි මූර්ත දර්ශකය ගණනය කරනු ලබයි.

**4.8 රූප සටහන**

**මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකවල වාර්ෂික සාමාන්‍ය වෙනස**




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
කම්කරු දෙපාර්තමේන්තුව

**4.5 සංඛ්‍යා සටහන**
**වැටුප් ප්‍රමාණ දර්ශක**

| සේවක කාණ්ඩ | දර්ශකය | | | | ප්‍රතිශත වෙනස | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | නාමික | | මූර්ත | | නාමික | | මූර්ත | |
| | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 |
| 1. රජයේ සේවකයන් | | | | | | | | |
| **සියලුම රජයේ සේවකයන් (2012=100)** | **160.8** | **161.0** | **130.9** (අ) | **128.3** (අ) | **0.0** | **0.1** | **-7.2** | **-2.0** |
| ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් | 170.4 | 170.4 | 138.7 (අ) | 135.7 (අ) | 0.0 | 0.0 | -7.2 | -2.2 |
| ද්විතීයික මට්ටමේ නිලධාරීන් | 161.6 | 161.6 | 131.5 (අ) | 128.8 (අ) | 0.0 | 0.0 | -7.2 | -2.1 |
| තෘතීයික මට්ටමේ නිලධාරීන් | 155.5 | 155.9 | 126.6 (අ) | 124.2 (අ) | 0.0 | 0.3 | -7.2 | -1.9 |
| ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් | 141.4 | 144.9 | 115.0 (අ) | 115.5 (අ) | 0.0 | 2.5 | -7.2 | 0.4 |
| 2. පඩිපාලක සභාවලට අයත් කම්කරුවන් | | | | | | | | |
| **සියලුම පඩිපාලක සභා (1978 දෙසැ=100)** | **4,128.6** | **4,155.2** | **97.4** (ආ) | **94.0** (ආ) | **0.0** | **0.6** | **-5.9** | **-3.5** |
| කෘෂිකර්මාන්තයෙහි නියැලෙන කම්කරුවන් | 4,736.7 | 4,748.8 | 111.8 (ආ) | 107.5 (ආ) | 0.0 | 0.3 | -5.9 | -3.9 |
| කර්මාන්ත හා වාණිජ කටයුතුවල නියැලෙන කම්කරුවන් | 3,459.1 | 3,545.3 | 81.6 (ආ) | 80.2 (ආ) | 0.0 | 2.5 | -5.9 | -1.7 |
| සේවා අංශයෙහි කම්කරුවන් | 2,313.2 | 2,331.2 | 54.6 (ආ) | 52.7 (ආ) | 0.0 | 0.8 | -5.9 | -3.4 |
| 3. අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් | | | | | | | | |
| **සියලුම අවිධිමත් පෞද්ගලික අංශ (2012=100)** | **149.7** | **169.5** | **121.8** (අ) | **135.0** (අ) | **9.5** | **13.2** | **1.7** | **10.8** |
| කෘෂිකර්මාන්ත | 150.9 | 172.6 | 122.8 (අ) | 137.4 (අ) | 10.3 | 14.3 | 2.3 | 11.9 |
| කර්මාන්ත | 155.0 | 173.0 | 126.1 (අ) | 137.8 (අ) | 10.2 | 11.6 | 2.3 | 9.2 |
| සේවා | 144.1 | 164.8 | 117.2 (අ) | 131.2 (අ) | 8.5 | 14.3 | 0.7 | 12.0 |

(අ) ජා.පා.මි.ද. (2013=100) මත පදනම් වේ.
(ආ) කො.පා.මි.ද. (2006/07=100) මත පදනම් වේ.

මූලයන්: කම්කරු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

4

කර්මාන්තවල අවම වැටුප්හි 2018 අගෝස්තු මාසයේ දී සිදු වූ ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් 2017 වසරේ සිදු වූ සියයට 5.9 ක පහළ යෑමට සාපේක්ෂව, 2018 වසරේ දී සියයට 3.5 කින් පහළ ගියේය. මසකට රුපියල් 10,000 ක් ලෙස පවතින වත්මන් අවම වැටුප වැඩි කිරීමට කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය විසින් 2018 වසරේ දී සාකච්ඡා අරඹන ලදී. මේ අතර, රුපියල් 1,000 ක අවම දෛනික වැටුපක් ඉල්ලා සිටිමින් වතු අංශයෙහි සේවකයන් වැඩ වර්ජනයක නිරත විය. 2019 වසර ආරම්භයේ දී, වතු අංශයෙහි සේවකයන්ගේ මූලික දෛනික වැටුප රුපියල් 500 සිට රුපියල් 700 දක්වා ඉහළ දමන ලදී.

**ශ්‍රම වෙළඳපොළෙහි පවතින ඉල්ලුම් සහ සැපයුම් තත්ත්ව මත අවිධිමත් අංශයෙහි වැටුප් බොහෝ දුරට තීරණය වීම හේතුවෙන්, 2018 වසරේ දී අවිධිමත් පෞද්ගලික අංශයෙහි නාමික සහ මූර්ත වැටුප්වල වර්ධනයක් දක්නට හැකි විය.** ඒ අනුව, අවිධිමත් පෞද්ගලික අංශයෙහි වැටුප් ප්‍රමාණ දර්ශකයෙහි (2012=100) වාර්ෂික සාමාන්‍ය වෙනස මගින් මනිනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්, පෙර වසරේ වාර්තා වූ සියයට 9.5 ක ඉහළ යෑමට සාපේක්ෂව 2018 වසරේ දී සියයට 13.2 කින් ඉහළ ගියේය. 2018 වසරේ දී කෘෂිකර්මාන්ත සහ සේවා යන උප අංශ දෙකෙහිම නාමික වැටුප් සියයට 14.3 කින් ඉහළ ගිය අතර, කර්මාන්ත උප අංශයෙහි නාමික වැටුප් සියයට 11.6 කින් ඉහළ යන ලදී. වසර තුළ පැවති නාමික වැටුප්වල වර්ධනය සහ පහළ උද්ධමන මට්ටම හේතුවෙන් 2018 වසරේ දී අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් සියයට 10.8 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

## 4.4 ජනගහනය, ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය

### ජනගහනය

**2018 වසරේ මධ්‍ය වාර්ෂික ජනගහනය මිලියන 21.7 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, වාර්ෂික ජනගහන වර්ධන වේගය පසුගිය වසර දෙකෙහි වාර්තා වූ සියයට 1.1 ක අගයෙහි නොවෙනස්ව පැවතුණි.** ජනගහන වර්ධනයට සමගාමීව, 2018 වසරේ ජන ඝනත්වය[4] 2017 වසරට සාපේක්ෂව වර්ග කිලෝමීටරයට පුද්ගලයන් 342 සිට 346 දක්වා වර්ධනය විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඇස්තමේන්තු කරනු ලබන පළාත් ද.දේ. නිෂ්පාදිතයට අනුව ද.දේ. නිෂ්පාදිතයට ප්‍රමුඛතම දායකත්වය සපයන බස්නාහිර පළාත, වැඩි ප්‍රතිශතයක් එනම් සියයට 28.3 ක් නියෝජනය කළ අතර මධ්‍යම, දකුණ සහ වයඹ පළාත් පිළිවෙලින් සියයට 12.7 ක්, සියයට 12.2 ක් සහ සියයට 11.7 ක් නියෝජනය කරන ලදී. මධ්‍ය වාර්ෂික ජනගහනයෙන් සියයට 5.2 ක්

4 වර්ග කිලෝමීටරයක භූමි ප්‍රදේශයක සිටින පුද්ගලයන් සංඛ්‍යාව


### 4.6 සංඛ්‍යා සටහන
### දිස්ත්‍රික්ක මට්ටමෙන් ජනගහනය සහ ජන ඝනත්වය (අ) (ආ)

| දිස්ත්‍රික්කය | 2017 | | 2018 | |
|---|---|---|---|---|
| | ජනගහනය පුද්ගලයන් '000 | ජන ඝනත්වය | ජනගහනය පුද්ගලයන් '000 | ජන ඝනත්වය |
| කොළඹ | 2,419 | 3,578 | 2,439 | 3,608 |
| ගම්පහ | 2,391 | 1,783 | 2,409 | 1,796 |
| කළුතර | 1,271 | 806 | 1,281 | 813 |
| මහනුවර | 1,452 | 757 | 1,468 | 766 |
| මාතලේ | 514 | 263 | 519 | 266 |
| නුවරඑළිය | 756 | 443 | 763 | 447 |
| ගාල්ල | 1,113 | 688 | 1,124 | 695 |
| මාතර | 851 | 670 | 858 | 676 |
| හම්බන්තොට | 647 | 259 | 655 | 262 |
| යාපනය | 608 | 654 | 613 | 660 |
| මන්නාරම | 107 | 57 | 109 | 58 |
| වව්නියාව | 184 | 99 | 187 | 100 |
| මුලතිව් | 96 | 40 | 96 | 40 |
| කිලිනොච්චිය | 124 | 103 | 126 | 105 |
| මඩකලපුව | 560 | 215 | 570 | 218 |
| අම්පාර | 705 | 167 | 719 | 170 |
| ත්‍රිකුණාමලය | 412 | 163 | 421 | 166 |
| කුරුණෑගල | 1,694 | 366 | 1,711 | 370 |
| පුත්තලම | 814 | 282 | 825 | 286 |
| අනුරාධපුරය | 918 | 138 | 930 | 140 |
| පොළොන්නරුව | 431 | 140 | 436 | 142 |
| බදුල්ල | 864 | 306 | 873 | 309 |
| මොණරාගල | 485 | 88 | 491 | 89 |
| රත්නපුරය | 1,151 | 356 | 1,163 | 359 |
| කෑගල්ල | 877 | 520 | 884 | 525 |
| **සමස්ත දිවයින** | **21,444** | **342** | **21,670** | **346** |

(අ) තාවකාලික
(ආ) මධ්‍ය වාර්ෂික ජනගහන දත්ත 2012 ජන හා නිවාස සංගණනය මත පදනම් වේ.

මූලය: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### 4.9 රූප සටහන
### මධ්‍ය වාර්ෂික ජනගහනය - 2018 (අ)




(අ) තාවකාලික

මූලය: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

නියෝජනය කරමින් උතුරු පළාත මේ වසරේ දී ද අඛණ්ඩව අවම ජනගහන ප්‍රතිශතයක් වාර්තා කළේය. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතිවලට සම්බන්ධ වන සංක්‍රමණික ශ්‍රම බලකාය නිසා ඇති විය හැකි අපේක්ෂිත ධනාත්මක ශුද්ධ සංක්‍රමණ හේතුවෙන් ඉදිරි වසරවල දී ජනගහනය තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**මධ්‍ය වාර්ෂික ජනගහනයෙන් සියයට 12.4[5] කින් සමන්විත වන, වයස අවුරුදු 60 සහ ඉහළ වයස් කාණ්ඩයට අයත් ජනගහනය, අනෙකුත් දකුණු ආසියාතික රටවල්වලට සාපේක්ෂව ඉහළ මට්ටමක පවතී.** එසේම මෙම අගය සංවර්ධනය වෙමින් පවතින රටක් සඳහා සාපේක්ෂව ඉහළ අගයකි. පසුගිය වසර ගණනාව පුරා වයස් සංයුතියෙහි සිදුවන මෙම ව්‍යුහාත්මක වෙනස සඳහා අඩු මරණ අනුපාතික සහ ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණ ප්‍රවණතා හේතු විය. මූලික වශයෙන් ඵලදායිතාව අඩුවීම, ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය අඩුවීම, පරිභෝජන අනුපාතික අඩුවීම, ඉතුරු කිරීම් අඩුවීම, වයස්ගත යැපුම් අනුපාතය වැඩිවීම සහ සමාජ සුභසාධනය හා සෞඛ්‍ය සඳහා රජයේ වියදම් වැඩිවීම යන ආකාරවලින් වයස්ගත ජනගහන සංසිද්ධිය, ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය කෙරෙහි අභියෝගාත්මක බලපෑම් එල්ල කරනු ලබයි. එබැවින්, ජනගහනය ආර්ථික කටයුතුවල දිගු කාලයක් නිරත කරවීම සඳහා, ක්‍රමික විශ්‍රාම ගැන්වීම (phased retirement), විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව ඉහළ දැමීම සහ කුසලතා වැඩි දියුණු කිරීම යනාදියට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ යුතුය.


## ශ්‍රම බලකාය

**වයස අවුරුදු 15 සහ ඊට වැඩි ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනය ලෙස අර්ථ දැක්වෙන ශ්‍රම බලකාය[6], මෑත කාලීනව නිරීක්ෂණය කරන ලද ප්‍රවණතාවලට අනුගත නොවුනු අතර, 2017 වසරේ වාර්තා වූ මිලියන 8.567 ට සාපේක්ෂව 2018 වසරේ දී මිලියන 8.388 දක්වා සියයට 2.1 කින් පහළ යන ලදී.** ශ්‍රම බලකායේ මෙම අඩුවීමට, 2018 වසරේ දී ස්ත්‍රී ශ්‍රම බලකාය පෙර වසරට සාපේක්ෂව සියයට 6.7 කින් අඩුවීම හේතු විය. ස්ත්‍රී ශ්‍රම බලකායෙන් සියයට 78.7 ක් කේන්ද්‍රගත වී ඇති ග්‍රාමීය අංශයෙහි, ස්ත්‍රී ශ්‍රම බලකායේ අඩුවීම කැපී පෙනේ. ශ්‍රම බලකායේ පහළ යෑමත් සමඟ 2017 වසරේ මිලියන 8.208 ක් ලෙස වාර්තා වූ සේවා

5 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද 2012 ජන හා නිවාස සංගණනය මත පදනම් වේ.

6 ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනයට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන කාර්තුමය ශ්‍රමබල සමීක්ෂණයේදී අදාළ කාලය තුළදී සේවා නියුක්තව හෝ වියුක්තව සිටින/ සිටි පුද්ගලයන් අයත් වේ.

**4.10 රූප සටහන**
**ශ්‍රම වෙළඳපොළ තොරතුරු - 2018 (අ)**




(අ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**4.7 සංඛ්‍යා සටහන**
**කුටුම්බ ජනගහනය, ශ්‍රම බලකාය සහ ශ්‍රම බලකා සහභාගිත්වය (අ) (ආ)**

| ශීර්ෂය | 2017 | 2018 (ඇ) | | | | |
|---|---|---|---|---|---|---|
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික |
| **කුටුම්බ ජනගහනය** | | | | | | |
| පුද්ගලයන් '000 | **15,844** | **16,034** | **16,348** | **16,177** | **16,226** | **16,196** |
| **ශ්‍රම බලකාය** | | | | | | |
| පුද්ගලයන් '000 | **8,567** | **8,333** | **8,352** | **8,388** | **8,478** | **8,388** |
| සේවා නියුක්ත | 8,208 | 7,961 | 7,970 | 8,041 | 8,088 | 8,015 |
| සේවා වියුක්ත | 359 | 372 | 382 | 347 | 389 | 373 |
| **ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (ඈ)** | **54.1** | **52.0** | **51.1** | **51.8** | **52.2** | **51.8** |
| පුරුෂ | 74.5 | 73.4 | 72.5 | 72.7 | 73.2 | 73.0 |
| ස්ත්‍රී | 36.6 | 33.5 | 32.5 | 34.0 | 34.3 | 33.6 |

(අ) වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය පිළිබඳ දත්ත ආවරණය කෙරේ.
(ආ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2011 වසරේ සිට ඉදිරියට, නැවත බර තැබූ සහ සංශෝධිත ශ්‍රම බලකා දත්ත ශ්‍රේණියක් 2016 ජූලි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදි.
(ඇ) තාවකාලික
(ඈ) ශ්‍රම බලකාය, කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


නියුක්ත ජනගහනය 2018 වසරේ දී මිලියන 8.015 ක් දක්වා සියයට 2.4 කින් පහළ ගිය අතර, සේවා වියුක්ත ජනගහනය 2018 වසරේ දී සියයට 3.9 කින් ඉහළ ගියේය. මේ අතර, ග්‍රාමීය අංශයෙහි ආර්ථික වශයෙන් සක්‍රීය නොවන ජනගහනය සියයට 8.4 කින් ඉහළ යෑම හේතුවෙන් 2018 වසරේ දී ආර්ථික අක්‍රීයභාවයෙහි ඉහළ යෑම කැපී පෙනුනි. ආර්ථික වශයෙන් සක්‍රීය හා සක්‍රීය නොවන පුද්ගලයන්ගේ එකතුවෙන් සමන්විත කුටුම්බ ජනගහනය, 2018 වසරේ දී සියයට 2.2 කින් වර්ධනය වූ හෙයින් ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය[7], 2017 වසරේ පැවති සියයට 54.1 සිට සියයට 51.8 දක්වා පහළ ගියේය.

**ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 2017 වසරේ වාර්තා වූ සියයට 36.6 හි සිට 2018 වසරේ දී සියයට 33.6 දක්වා පහළ යෑම හේතුවෙන් ශ්‍රම බලකායේ ස්ත්‍රී පුරුෂ සහභාගිත්ව පරතරය තවදුරටත් පුළුල් විය.** අධ්‍යාපනික හා වෘත්තීමය සුදුසුකම් ලබා ගත් කාන්තාවන් සංඛ්‍යාව ඉහළ යමින් පැවතිය ද,

7 ශ්‍රම බලකාය සහ වයස අවුරුදු 15 හා ඊට වැඩි කුටුම්බ ජනගහනය අතර අනුපාතය, ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකයයි.

**4.11 රූප සටහන**

**ශ්‍රම බලකායේ සහ සේවා වියුක්තියේ ප්‍රවණතා (2013-2018)**





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ශ්‍රම බලකායේ ස්ත්‍රී සහභාගිත්වය සැලකූ විට ශ්‍රී ලංකාව තවමත් පසුගාමී තත්ත්වයක පසුවෙයි. ඒ අනුව, වැඩ කරන වයසේ පසුවන කාන්තාවන් සැලකිය යුතු ප්‍රමාණයක් ආර්ථික වශයෙන් ජාතික ආර්ථිකයට දායකත්වයක් දක්වනු නොලබයි. රැකියා සඳහා අවශ්‍ය නිපුණතා සම්බන්ධ ගැටලු, ශ්‍රම වෙළඳපොළ තුළ කාන්තාවන් සඳහා රැකියා අවස්ථා අවම වීම, රැකියා අවස්ථා, වැටුප් හා උසස් වීම් සම්බන්ධ ස්ත්‍රී පුරුෂ විෂමතා, රැකියා ස්ථානයේ දී හා පොදු ප්‍රවාහනයේ දී සිදුවන හිංසන, යල්පැන ගිය සමාජ සම්මත, ළමා සුරැකුම් පහසුකම්වල මිල අධික වීම සහ ශ්‍රී ලාංකික කාන්තාවන්ගෙන් අපේක්ෂා කරන සමාජ භූමිකා හා වගකීම් වැනි සාධක ගණනාවක් ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්වය අඩුවීමට හේතු වී ඇත. එබැවින්, කාන්තාවන් ආර්ථික වශයෙන් වඩා සක්‍රිය වීමට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ඇති කිරීමට, ලිංගික හිංසනය මුළුමනින් පිටු දැකීමට, නම්‍යශීලී සේවා මුර හා නිවසේ සිට වැඩ කිරීම වැනි සහනදායි වැඩපිළිවෙළවල් සකස් කිරීමට සහ දැරිය හැකි මිල ගණන් යටතේ ඉහළ ගුණාත්මක බවින් යුතු ළමා හා වැඩිහිටි සුරැකුම් පහසුකම් හා ආරක්ෂාකාරී ප්‍රවාහනය වැනි ආධාරක පහසුකම් ලබා දීමට අවශ්‍ය ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම අත්‍යවශ්‍ය වේ. මෙවැනි මුලපිරීම් සමස්තයක් ලෙස ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය ඉහළ නැංවීමට සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ලබන අතර, එය රටෙහි ආර්ථික වර්ධනය සඳහා ද දායක වනු ඇත.

**4.12 රූප සටහන**

**රැකියාවේ සේවා තත්ත්වය අනුව සේවා නියුක්තිය - 2018**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


## සේවා නියුක්තිය

සේවා නියුක්ත ජනගහනය 2017 වසරේ දී වාර්තා වූ මිලියන 8.208 හි සිට 2018 වසරේ දී මිලියන 8.015 දක්වා සියයට 2.4 කින් පහළ ගියේය. 2018 වසරේ දී ද සේවා අංශය මුළු සේවා නියුක්ත ජනගහනයෙන් බහුතරය අඛණ්ඩව නියෝජනය කරමින්, සමස්ත සේවා නියුක්තියෙන් සියයට 46.6 කට දායක විය. 2018 වසරේ දී කර්මාන්ත අංශය, මුළු සේවා නියුක්තියෙන් සියයට 27.9 කට දායක වූ අතර, කෘෂිකර්මාන්ත අංශයේ දායකත්වය පසුගිය වසරේ වාර්තා වූ සියයට 26.1 ට සාපේක්ෂව සියයට 25.5 ක් විය. ඒ අනුව, සේවා නියුක්ති ව්‍යුහයේ වෙනස් වීම පෙන්නුම් කරමින්, කෘෂිකර්මාන්ත අංශයේ සේවා නියුක්ති දායකත්වය 2018 වසරේ දී තවදුරටත් පහළ ගියේය.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන කාර්තුමය ශ්‍රමබල සමීක්ෂණයට අනුව පෞද්ගලික අංශය අඛණ්ඩව ශ්‍රී ලංකාවේ ප්‍රධානතම රැකියා උත්පාදන අංශය ලෙස වාර්තා කරමින්, 2018 වසරේ සමස්ත සේවා නියුක්තියට

**4.13 රූප සටහන**

**ස්ත්‍රී - පුරුෂභාවය අනුව රැකියාවේ සේවා තත්ත්වයේ ප්‍රතිශත ව්‍යාප්තිය - 2017**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

4

**4.8 සංඛ්‍යා සටහන**

**ආර්ථික ක්‍රියාකාරිත්වය අනුව සේවා නියුක්තිය (අ) (ආ) (ඇ)**

| අංශය | පුද්ගලයන් '000 | | | | | | මුළු සේවා නියුක්තියේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2017 | 2018 (ඈ) | | | | | 2017 | 2018 (ඈ) |
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික | | |
| **කෘෂිකර්මාන්ත** | **2,140** | **2,139** | **1,928** | **2,035** | **2,073** | **2,044** | **26.1** | **25.5** |
| **කර්මාන්ත** | **2,331** | **2,224** | **2,190** | **2,306** | **2,237** | **2,239** | **28.4** | **27.9** |
| පතල් හා කැණීම් | 63 | 55 | 78 | 63 | 53 | 62 | 0.8 | 0.8 |
| නිෂ්පාදන | 1,581 | 1,472 | 1,363 | 1,529 | 1,492 | 1,464 | 19.3 | 18.3 |
| ඉදිකිරීම්, විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සමීකරණ සැපයුම, ජල එකතු කිරීම, පිරිසිදු කිරීම හා බෙදා හැරීම (ගොවිතැන් කටයුතු හැර) | 688 | 698 | 748 | 715 | 692 | 713 | 8.4 | 8.9 |
| **සේවා** | **3,737** | **3,598** | **3,852** | **3,700** | **3,779** | **3,732** | **45.5** | **46.6** |
| තොග සහ සිල්ලර වෙළඳාම, මෝටර් වාහන හා යතුරු පැදි අලුත් වැඩියා කිරීම | 1,160 | 1,138 | 1,131 | 1,145 | 1,152 | 1,141 | 14.1 | 14.2 |
| ප්‍රවාහනය සහ ගබඩා කිරීම් | 513 | 493 | 528 | 488 | 499 | 502 | 6.3 | 6.3 |
| නවාතැන් හා ආහාර සැපයීම | 210 | 216 | 233 | 253 | 250 | 238 | 2.6 | 3.0 |
| තොරතුරු හා සන්නිවේදන ප්‍රකාශන කටයුතු | 70 | 52 | 65 | 60 | 43 | 55 | 0.9 | 0.7 |
| මුල්‍ය සහ රක්ෂණ කටයුතු | 160 | 186 | 192 | 162 | 153 | 173 | 1.9 | 2.2 |
| වෘත්තිය, විද්‍යාත්මක හා තාක්ෂණ කටයුතු | 70 | 77 | 83 | 88 | 97 | 86 | 0.8 | 1.1 |
| පරිපාලනමය සහ සහාය සේවා කටයුතු | 152 | 134 | 181 | 169 | 184 | 167 | 1.9 | 2.1 |
| රාජ්‍ය පරිපාලන සහ ආරක්ෂණය, අත්‍යවශ්‍ය සමාජ ආරක්ෂණය | 527 | 457 | 444 | 383 | 454 | 434 | 6.4 | 5.4 |
| අධ්‍යාපනය | 377 | 392 | 466 | 408 | 434 | 425 | 4.6 | 5.3 |
| මහජන සෞඛ්‍ය සහ සමාජ සේවා කටයුතු | 149 | 141 | 151 | 150 | 129 | 143 | 1.8 | 1.8 |
| වෙනත් (ඉ) | 348 | 313 | 376 | 395 | 382 | 366 | 4.2 | 4.6 |
| **මුළු සේවා නියුක්තිය** | **8,208** | **7,961** | **7,970** | **8,041** | **8,088** | **8,015** | **100.0** | **100.0** |
| ශ්‍රම බලකායේ ප්‍රතිශතය | 95.8 | 95.5 | 95.4 | 95.9 | 95.4 | 95.6 | | |

(අ) ජාත්‍යන්තර ප්‍රමිත කර්මාන්ත වර්ගීකරණ 4 වන සංශෝධනය මත පදනම් වේ.
(ආ) වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය පිළිබඳ දත්ත ආවරණය කෙරේ.
(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2011 වසරේ සිට ඉදිරියට, නැවත බර තැබූ සහ සංශෝධිත ශ්‍රම බලකා දත්ත ශ්‍රේණියක් 2016 ජූලි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදී.
(ඈ) තාවකාලික
(ඉ) නිවැසියන්ගේ පරිහරණය සඳහා සම්පාදනය කරනු ලබන සේවායෝජක කටයුතු, දේපල වෙළඳාම් කටයුතු, කලා හා පොදු විනෝදාත්මක කටයුතු සහ ජාත්‍යන්තර සංවිධාන කටයුතු ඇතුළත් වේ.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සියයට 43.4 ක ඉහළම දායකත්වය දක්වන ලදී. සේව්‍යයන්, තමාගේම වැඩ කටයුතු කරන්නන් සහ ගෙවීම් නොලබන පවුලේ සාමාජිකයන් යන උප කාණ්ඩ තුනෙන් සමන්විත ස්වයං රැකියාවල නියුතු වූවන්ගේ කාණ්ඩය ද 2018 වසරේ දී සමස්ත සේවා නියුක්තියෙන් සියයට 42.2 ක ඉහළ නියෝජනයක් සිදු කළ අතර, 2018 වසරේ දී, තමාගේම වැඩ කටයුතු කරන්නන්, ගෙවීම් නොලබන පවුලේ සාමාජිකයන් සහ සේව්‍යයන් යන උප කාණ්ඩ, පිළිවෙලින්, සියයට 32.3 ක්, සියයට 7.2 ක් සහ සියයට 2.8 ක් නියෝජනය කළේය. මේ අතර, 2018 වසරේ දී රාජ්‍ය අංශය, සමස්ත සේවා නියුක්තියෙන් සියයට 14.5 ක් නියෝජනය කළේය.

**4.9 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය**


| අංශය | 2016 | 2017 (අ) | 2018 (ආ) | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|
| | | | | 2017/ 2016 (අ) | 2018/ 2017 (ආ) |
| රාජ්‍ය (ඇ) | 1,146,995 | 1,152,211 | 1,161,891 | 0.5 | 0.8 |
| අර්ධ රාජ්‍ය (ඈ) | 242,772 | 244,514 | 248,707 | 0.7 | 1.7 |
| **සමස්ත රාජ්‍ය අංශය** | **1,389,767** | **1,396,725** | **1,410,598** | **0.5** | **1.0** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මධ්‍යම රජය, පළාත් පාලන ආයතන හා පළාත් සභා
(ඈ) රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රාජ්‍ය අධිකාරීන්

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලබන රාජ්‍ය අංශයේ සේවා නියුක්ති සමීක්ෂණයට අනුව, රාජ්‍ය අංශයේ සමස්ත සේවා නියුක්තිය 2017 වසරේ වාර්තා වූ මිලියන 1.397 ට සාපේක්ෂව 2018 වසර අවසානයේ දී මිලියන 1.411 ක් විය. මෙම සමීක්ෂණයට අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් සභා සහ අර්ධ රාජ්‍ය ආයතනවල සේවා නියුක්තිකයන් ඇතුළත් වේ.

**4.14 රූප සටහන**
**සේවා වියුක්ති අනුපාතිකය (%)**




මූලයː ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## සේවා වියුක්තිය

**සේවා වියුක්ති අනුපාතිකය 2017 වසරේ වාර්තා වූ සියයට 4.2 හි සිට 2018 වසරේ දී සියයට 4.4 දක්වා ඉහළ ගිය අතර ස්ත්‍රීන්, තරුණ තරුණියන් සහ අධ්‍යාපන සුදුසුකම් සහිත කාණ්ඩවල ඉහළම සේවා වියුක්ති අනුපාතික වාර්තා විය.** අඩු ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සහ ඉහළ ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතිකය ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන ගැටලු බවට පත්ව ඇති අතර, ආර්ථික වශයෙන් සක්‍රීය කාන්තාවන් සඳහා සමාන අවස්ථා නිර්මාණය කිරීමට ප්‍රතිපත්තිමය මැදිහත් වීම් අවශ්‍ය වේ. 2018 වසරේ දී තරුණ විරැකියා අනුපාතිකය සලකන විට, වයස අවුරුදු 15-24 කාණ්ඩයෙන් සහ වයස අවුරුදු 25-29 කාණ්ඩයෙන් පිළිවෙලින් සියයට 21.4 ක සහ සියයට 10.4 ක ඉහළ විරැකියා අනුපාතික වාර්තා විය. අධ්‍යාපන සුදුසුකම් අනුව අ.පො.ස. (උ.පෙළ) සහ ඊට ඉහළ කාණ්ඩය තුළ වාර්තා වූ සේවා වියුක්තිය, 2017 වසරේ වාර්තා වූ සියයට 8.1 ක අගයට සාපේක්ෂව 2018 වසරේ දී සියයට 9.1 ක් ලෙස වාර්තා විය.

**4.10 සංඛ්‍යා සටහන**
**සේවා වියුක්ති අනුපාතිකය (අ) (ආ)**

| කාණ්ඩය | 2017 | 2018 (ඇ) | | | | |
|---|---|---|---|---|---|---|
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික |
| **සමස්ත** | **4.2** | **4.5** | **4.6** | **4.1** | **4.6** | **4.4** |
| ස්ත්‍රී/පුරුෂ අනුව | | | | | | |
| පුරුෂ | 2.9 | 2.9 | 3.1 | 2.8 | 3.2 | 3.0 |
| ස්ත්‍රී | 6.5 | 7.4 | 7.4 | 6.6 | 7.1 | 7.1 |
| අධ්‍යාපන මට්ටම අනුව | | | | | | |
| 5 ශ්‍රේණිය සමත් සහ ඊට පහළ | ... | ... | ... | ... | ... | ... |
| 6-10 ශ්‍රේණි | 2.8 | 3.0 | 3.5 | 2.4 | 2.5 | 2.9 |
| අ.පො.ස. (සා.පෙළ) | 5.9 | 5.3 | 4.8 | 4.8 | 6.1 | 5.2 |
| අ.පො.ස. (උ.පෙළ) සහ ඊට ඉහළ | 8.1 | 9.5 | 8.9 | 9.5 | 8.7 | 9.1 |
| වයස් කාණ්ඩ අනුව (අවුරුදු) | | | | | | |
| 15-19 | 21.0 | 23.7 | 28.5 | 22.5 | 31.2 | 26.5 |
| 20-24 | 17.8 | 21.2 | 20.9 | 18.7 | 19.6 | 20.1 |
| 25-29 | 9.5 | 10.7 | 10.8 | 10.6 | 9.5 | 10.4 |
| 30-39 | 2.7 | 3.3 | 3.3 | 2.7 | 2.6 | 3.0 |
| 40 සහ ඊට ඉහළ | 0.9 | 0.7 | 0.6 | 0.6 | 1.0 | 0.7 |

(අ) වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය පිළිබඳ දත්ත ආවරණය කෙරේ.
(ආ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2011 වසරේ සිට ඉදිරියට, නැවත බර තැබූ සහ සංශෝධිත ශ්‍රම බලකා දත්ත ශ්‍රේණියක් 2016 ජූලි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදි.
(ඇ) තාවකාලික

මූලයː ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**ශ්‍රම වෙළඳපොළෙහි රැකියා සහ නිපුණතා අතර ඇති නොගැළපීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රම හිඟයක් පවතින අතර, ඇතැම් කර්මාන්ත සඳහා ශ්‍රමය ආනයනය කිරීමේ අවශ්‍යතාවක් පැන නැඟී ඇත.** නිපුණතා පරතරයට අමතරව, තරුණ පරපුර ඒකාකාරි සහ ශ්‍රමය යොදවන රැකියා වෙනුවට ඒකාකාරී නොවන සහ බුද්ධිය යොදවන රැකියාවලට (cognitive jobs) වැඩි කැමැත්තක් දැක්වීම හේතුවෙන්, රැකියා අපේක්ෂකයන්ගේ බලාපොරොත්තු සහ ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතා අතර විශාල පරතරයක් දක්නට ලැබේ. තවද, වැඩවල පවතින ඛණ්ඩිත (fragmented) සහ තාවකාලික ස්වභාවය හේතුවෙන් රැකියා අපේක්ෂකයන් ඉදිකිරීම් කර්මාන්තය වැනි කර්මාන්තවල රැකියා සඳහා ආකර්ෂණය වීම අවම වී ඇත. එබැවින්, ශීඝ්‍රයෙන් පුළුල් වන ඉදිකිරීම් කර්මාන්තයේ වර්ධනය වන ශ්‍රම අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රධාන වශයෙන්ම චීනය, ඉන්දියාව, නේපාලය සහ මියන්මාරය යන රටවලින් ශ්‍රමය ආනයනය කිරීමට බලධාරීන්ට සිදු වී ඇත. කෙසේ වෙතත්, අඩු පිරිවැය සහිත ශ්‍රමය ආනයනය කිරීම වෙනුවට, ශ්‍රම සූක්ෂ්ම නිෂ්පාදන වලින් ඉවත් වී, නිෂ්පාදන ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය කිරීම සහ ශ්‍රම බලකායේ නිපුණතා ඉහළ නැංවීම හා ශ්‍රම වෙළඳපොළේ ඉල්ලුමක් පවතින නිපුණතා සඳහා නැවත පුහුණු කිරීම වැනි දිගුකාලීන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම යෝග්‍ය වේ.

**මානව ප්‍රාග්ධනය රටක ආර්ථික සංවර්ධනයෙහි ප්‍රධාන සාධකයක් ලෙස හඳුනාගෙන ඇති බැවින්, ශ්‍රී ලංකාව තුළ දැනට හඳුනා නොගත් නිපුණතා පූර්ණ පුද්ගලයන්, කාර්යක්ෂම ලෙස සංවර්ධන කටයුතු සඳහා උපයෝජනය කිරීම අත්‍යවශ්‍ය වේ.** එබැවින්, නිපුණතා පූර්ණ තිරසාර ශ්‍රම සැපයුමක් ඇති කිරීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික හවුල්කාරීත්වය තුළින් දැනට සිටින ශ්‍රම බලකායේ නිපුණතා වර්ධනය කිරීම මෙන්ම ශ්‍රම වෙළඳපොළෙහි ඉල්ලුමක් පවතින නිපුණතා සඳහා නැවත පුහුණු කිරීම සිදු කරන අතරම, රජයේ

**4.11 සංඛ්‍යා සටහන**

**විදේශ රැකියා සඳහා පිටව යෑම්**

| විදේශ සේවා නියුක්තිය | 2016 | | 2017 (අ) | | 2018 (ආ) | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | දායකත්වය % | සංඛ්‍යාව | දායකත්වය % | සංඛ්‍යාව | දායකත්වය % |
| **මුළු විදේශ රැකියා සංඛ්‍යාව** | **242,816** | **100.0** | **211,992** | **100.0** | **211,459** | **100.0** |
| **මූලයන් අනුව** | | | | | | |
| ලියාපදිංචි නියෝජිතයන් | 87,982 | 36.2 | 68,319 | 32.2 | 66,924 | 31.6 |
| වෙනත් | 154,834 | 63.8 | 143,673 | 67.8 | 144,535 | 68.4 |
| **ස්ත්‍රී/පුරුෂ අනුව** | | | | | | |
| පුරුෂ | 160,306 | 66.0 | 139,268 | 65.7 | 129,774 | 61.4 |
| ස්ත්‍රී | 82,510 | 34.0 | 72,724 | 34.3 | 81,685 | 38.6 |
| **ශ්‍රම කාණ්ඩය අනුව** | | | | | | |
| වෘත්තීය | 6,578 | 2.7 | 6,379 | 3.0 | 7,210 | 3.4 |
| මධ්‍යම | 8,234 | 3.4 | 7,127 | 3.4 | 7,748 | 3.7 |
| ලිපිකරු හා ඒ ආශ්‍රිත | 10,862 | 4.5 | 9,271 | 4.4 | 10,021 | 4.7 |
| පුහුණු ශ්‍රමික | 76,545 | 31.5 | 68,980 | 32.5 | 67,053 | 31.7 |
| අර්ධ පුහුණු ශ්‍රමික | 3,926 | 1.6 | 3,297 | 1.6 | 2,770 | 1.3 |
| නුපුහුණු ශ්‍රමික | 71,656 | 29.5 | 61,054 | 28.8 | 51,719 | 24.5 |
| ගෘහ සේවිකා | 65,015 | 26.8 | 55,884 | 26.4 | 64,938 | 30.7 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය



අරමුදලින් හෝ දායක අරමුදල්වලින් පවත්වාගෙන යනු ලබන නිපුණතා සංවර්ධන වැඩසටහන්වලට පාසල් හැරයන්නන් ආකර්ෂණය කර ගැනීමට රජයට පහසුකම් සැලසිය හැකිය. එවැනි නිපුණතා සංවර්ධන වැඩසටහන් මගින් නිපුණතා පරතරය අවම කර, තරුණ කොටස් අඩු ඵලදායි රැකියාවල නිරත වීමේ අවස්ථා අවම කරගත හැකි වේ. තවද, අ.පො.ස. සාමාන්‍ය පෙළින් පසු අධ්‍යාපනය නොලබන සිසුන් සඳහා තාක්ෂණික, වෘත්තීය හා සමාජ කුසලතා ලබාදීම අරමුණු කොටගෙන අනිවාර්ය අධ්‍යාපනය ලැබීමේ කාලසීමාව අවුරුදු 13 දක්වා වැඩි කිරීමට ද රජය මූලික පියවර ගෙන තිබේ.


## විදේශ සේවා නියුක්තිය

**විදේශ රැකියා සඳහා පිටව ගිය කාන්තාවන් සංඛ්‍යාව ඉහළ ගිය ද විදේශ රැකියා සඳහා පිටව ගිය මුළු සංඛ්‍යාව සුළු වශයෙන් පහළ ගියේය.** ඒ අනුව, 2017 වර්ෂයේ 139,268 ක් වූ විදේශ රැකියා සඳහා පිටව ගිය පුරුෂයන් සංඛ්‍යාව 2018 වසරේ දී 129,774 ක් දක්වා සියයට 6.8 කින් පහළ යන ලදී. එසේ වුවද, 2018 වසරේ දී විදේශ රැකියා සඳහා පිටව ගිය කාන්තාවන් සංඛ්‍යාව 2017 වසරට සාපේක්ෂව 72,724 සිට 81,685 දක්වා සියයට 12.3 කින් ඉහළ ගිය අතර ඒ සඳහා විශේෂයෙන්ම අවුරුදු 35-44 අතර වයස් කාණ්ඩයේ ගෘහ සේවිකා රැකියා සඳහා කාන්තා පිටව යෑම් වැඩිවීම ඉවහල් විය. 2018 වසරේ දී නුපුහුණු ශ්‍රමිකයින් විදේශ රැකියා සඳහා පිටව යෑම් සියයට 15.3 කින් අඩු වුවද, නුපුහුණු සහ ගෘහ සේවිකා කාණ්ඩ තවදුරටත්, විදේශ රැකියා සඳහා සමස්ත පිටව යෑම් වලින් සියයට 55.2 ක් නියෝජනය කරයි. විදේශ රැකියා නියෝජිත ආයතන විසින් ව්‍යාජ හෝ කූට ලියකියවිලි හරහා බොහෝ බාලවයස්කාර කාන්තාවන් විදේශ රැකියාවලට යැවීම සිදු කරන හෙයින්, විදේශ සේවා නියුක්තිය නියාමනය කිරීම සහ මානව ජාවාරම් පාලනය කිරීම සඳහා නව පනතක් හඳුන්වා දීම පිළිබඳව රජයේ සැලකිල්ල යොමු වී ඇත.

**නුපුහුණු ශ්‍රමිකයන් විදේශ රැකියා සඳහා පිටව යෑම අවම කරමින් විවිධ ක්ෂේත්‍රවල වර්ධනය වෙමින් පවතින අර්ධ පුහුණු සහ පුහුණු ශ්‍රම වෙළඳපොළ වෙත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් යොමු කිරීමට හැකියාව පවතී.** විදෙස් රැකියා අවස්ථා අපේක්ෂා කරන ශ්‍රී ලාංකිකයන්ට, විධිමත් පුහුණුවක් ලබා දීම සඳහා හෙද, වෛද්‍ය,

**4.15 රූප සටහන**

**නිපුණතා කාණ්ඩ අනුව විදේශ රැකියා සඳහා පිටව යෑම්**




මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

**4.12 සංඛ්‍යා සටහන**

**ගමනාන්තය අනුව විදේශ සේවා සංක්‍රමණ**

| රට | 2017 (අ) | | 2018 (ආ) | | වෙනස (ආ) | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | දායකත්වය % | සංඛ්‍යාව | දායකත්වය % | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| සෞදි අරාබිය | 37,745 | 17.8 | 35,866 | 17.0 | -1,879 | -5.0 |
| කටාර් | 56,637 | 26.7 | 50,774 | 24.0 | -5,863 | -10.4 |
| කුවේට් | 37,410 | 17.6 | 46,951 | 22.2 | 9,541 | 25.5 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 36,667 | 17.3 | 32,836 | 15.5 | -3,831 | -10.4 |
| වෙනත් | 43,533 | 20.5 | 45,032 | 21.3 | 1,499 | 3.4 |
| **එකතුව** | **211,992** | **100.0** | **211,459** | **100.0** | **-533** | **-0.3** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

තොරතුරු තාක්ෂණ, මූල්‍ය, ගිණුම්කරණ, කළමනාකරණ, ඉංජිනේරු වැනි ක්ෂේත්‍ර මෙන්ම සංචාරක, මුහුදු සහ ගුවන් ප්‍රවාහනය, උසස් තාක්ෂණ නිෂ්පාදන, ඉදිකිරීම්, සෞඛ්‍ය සේවා වැනි කර්මාන්ත සලකා බැලිය හැකිය. පිලිපීනය, බංග්ලාදේශය, ඉන්දියාව, පකිස්ථානය, චීනය සහ අනෙකුත් ආසියානු රටවල් අභිබවමින් ශ්‍රී ලංකාව විසින් ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඉල්ලුම සපුරාලීම සඳහා නිපුණතා සහිත ශ්‍රම සැපයුම ශක්තිමත් කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලවන පරිදි තාක්ෂණික සහ වෘත්තීය පුහුණු ක්‍රියාවලීන් වැඩි දියුණු කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.

**සමස්ත පිටව යෑම් වලින් සියයට 88.2 ක් පමණ වාර්තා කරමින් මැද පෙරදිග කලාපය තවදුරටත් රැකියා සඳහා විදේශ ගතවීම් සම්බන්ධයෙන් ප්‍රමුඛ ස්ථානයේ රැඳී සිටියි.** ගෘහ සේවිකාවන්ගෙන් සියයට 97.4 ක් හා නුපුහුණු ශ්‍රමිකයන්ගෙන් සියයට 78.0 ක් සෞදි අරාබිය, කටාර්, කුවේට් සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය වැනි මැද පෙරදිග රටවල්වල සංකේන්ද්‍රණය වී ඇත. ස්ත්‍රී පුරුෂභාවය අනුව සැලකූ විට පුරුෂ පිටව යෑම් වලින් සියයට 85.0 ක් සහ කාන්තා පිටව යෑම් වලින් සියයට 93.3 ක් මැද පෙරදිග කලාපය තුළ සංකේන්ද්‍රණය වී ඇත.

**විරැකියා අනුපාතිකය අඩු කිරීම සහ ආදායම් ඉපයීම මගින් දිළිඳුකම අඩු කිරීම සඳහා ඉටු කරන සැලකිය යුතු කාර්යභාරය සහ පෞද්ගලික ප්‍රේෂණ විදේශ විනිමය ඉපයීමේ ප්‍රධාන මූලාශ්‍රවලින් එකක් වීම හේතුවෙන්, විදේශ රැකියා ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි විශාල බලපෑමක් ඇති කරයි.** කෙසේ වෙතත්, ආර්ථික අවපාත හේතුවෙන් ශ්‍රම ඉල්ලුම සඳහා විදේශ ශ්‍රම වෙළඳපොළවල සිදු විය හැකි විචලන, දේශපාලනික නොසන්සුන්තා සහ ගැටුම්, සංක්‍රමණික ශ්‍රමය සීමා කිරීම සඳහා වන ප්‍රතිපත්තිමය වෙනස්කම්, ස්වයංක්‍රීයකරණය හා තාක්ෂණික විපර්යාස සහ ශ්‍රම අපනයනය කරන රටවල් අතර පවතින තරඟකාරීත්වය හේතුවෙන්, පෞද්ගලික ප්‍රේෂණ මත වැඩි වශයෙන් රඳා පැවතීම, ශ්‍රී ලංකාවේ ආර්ථිකයට තර්ජනයක් විය හැක. මීට අමතරව, කාන්තාවන් විදෙස් රැකියා සඳහා සංක්‍රමණය වීම තුළින් ඇතිවන සමාජ ගැටලු හා සමාජ පිරිවැය, ශ්‍රමය සූරාකෑම, ගෙවීම් නොකිරීම හෝ අඩුවෙන් ගෙවීම හා ශාරීරික අපයෝජනය වැනි මානව හිමිකම් උල්ලංඝනය වීම් සහ ශ්‍රී ලංකාවේ කර්මාන්ත කිහිපයක පවතින ශ්‍රම හිඟය හේතු කොටගෙන, විදේශ විනිමය ඉපැයීම් ඉහළ නැංවීම සඳහා සේවක ප්‍රේෂණ මත වැඩි වශයෙන් රඳා පැවතීම අඩු කිරීමට ප්‍රබල අවශ්‍යතාවයක් පැන නැගී ඇත. ඒ අනුව, ගෘහ සේවිකා සහ නුපුහුණු කාණ්ඩවල විදේශ රැකියා සඳහා පිටව යෑම් අවම කරමින් පුහුණු සහ අර්ධ පුහුණු කාණ්ඩ යටතේ පිටව යෑම් වලට අවධානය යොමු කිරීමට අවශ්‍ය උපායමාර්ගික ක්‍රියාමාර්ග ගත යුතුය.

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ශ්‍රම සංක්‍රමණ ක්‍රියාවලිය නියාමනය කිරීම සඳහා මෙන්ම සංක්‍රමණික සේවකයන් සහ ඔවුන්ගේ පවුල් සවිබල ගැන්වීම සඳහා වන ක්‍රියාමාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.** ඒ අනුව, ශ්‍රී ලාංකික ශ්‍රම සංක්‍රමණිකයන් විශ්වාසවන්ත රැකියා අවස්ථාවල නිරත වීම තහවුරු කිරීම අරමුණු කොට ගෙන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් 2018 වසරේ දී විදේශ රැකියා සඳහා නීති විරෝධී ලෙස පුද්ගලයන් බඳවා ගැනීම් සම්බන්ධ වැටලීම් 155 ක් සිදුකරන ලද අතර, නීති උල්ලංඝනය කළ නීති විරෝධී ආයතන සහ බලපත්‍රලාභී ආයතනවලට එරෙහිව නඩු 213 ක් පවරන ලදී. සංක්‍රමණික සේවකයන් සඳහා සුබසාධන සහ ආරක්ෂක පියවර ලෙස, සංක්‍රමණික සේවකයන් 211,093 ක් ආවරණය වන පරිදි රක්ෂණ ආයතනයක් සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් රුපියල් මිලියන 138.25 ක් ගෙවීම ද, සංක්‍රමණික සේවකයන්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව 2,019 ක් ප්‍රදානය කිරීම සඳහා රුපියල් මිලියන 49.27 ක වියදමක් දැරීම ද, පිටරටවල දී මුහුණ පෑ විවිධ ගැටලු හේතුවෙන් සංක්‍රමණික සේවකයන් 25 දෙනෙක් ආපසු මෙරටට ගෙන්වා ගැනීමට සේවක සුබසාධක අරමුදලින් සහ රක්ෂණ යෝජනා ක්‍රමයෙන් රුපියල් මිලියන 0.97 ක් උපයෝගී කර ගැනීම මෙන්ම සංක්‍රමණික සේවකයන්ගේ විවිධ ගැටලු සම්බන්ධයෙන් ලද පැමිණිලි 3,754 ක් නිරවුල් කිරීම ද සිදු කරන ලදී. තවද, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් මැද පෙරදිග, යුරෝපීය සහ නැගෙනහිර ආසියාතික රටවල් වූ සිංගප්පූරුව, සයිප්‍රසය, හොංකොං හා මාලදිවයින වැනි රටවල රැකියාවලට පිටව යෑම සඳහා අනිවාර්ය පෙර පුහුණුවක් ලෙස 'වෘත්තීය නිපුණතා සහතිකය (NVQ) 3 මට්ටම' හඳුන්වා දී ඇත. මීට අමතරව, සංක්‍රමණික

4

**4.13 සංඛ්‍යා සටහන**

**පෞද්ගලික අංශයේ කර්මාන්තවල වැඩ වර්ජන**

| වර්ෂය | වතු අංශය | | | වෙනත් අංශ (අ) | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන |
| 2015 | 31 | 10,427 | 70,697 | 20 | 4,488 | 11,597 | 51 | 14,915 | 82,294 |
| 2016 | 26 | 11,185 | 85,637 | 15 | 10,167 | 18,690 | 41 | 21,352 | 104,327 |
| **2017 (ආ)** | **12** | **1,885** | **5,643** | **21** | **9,027** | **54,436** | **33** | **10,912** | **60,079** |
| පළමු කාර්තුව | 3 | 343 | 1,011 | 9 | 3,344 | 23,258 | 12 | 3,687 | 24,269 |
| දෙවන කාර්තුව | 6 | 767 | 2,632 | 6 | 2,401 | 6,452 | 12 | 3,168 | 9,084 |
| තෙවන කාර්තුව | 1 | 335 | 1,340 | 5 | 2,682 | 22,926 | 6 | 3,017 | 24,266 |
| සිව්වන කාර්තුව | 2 | 440 | 660 | 1 | 600 | 1,800 | 3 | 1,040 | 2,460 |
| **2018 (ඇ)** | **27** | **6,545** | **33,212** | **22** | **5,940** | **18,211** | **49** | **12,485** | **51,423** |
| පළමු කාර්තුව | 6 | 886 | 6,152 | 7 | 1,706 | 5,791 | 13 | 2,592 | 11,943 |
| දෙවන කාර්තුව | 6 | 1,073 | 6,606 | 2 | 690 | 4,170 | 8 | 1,763 | 10,776 |
| තෙවන කාර්තුව | 7 | 703 | 3,759 | 8 | 1,010 | 3,181 | 15 | 1,713 | 6,940 |
| සිව්වන කාර්තුව | 8 | 3,883 | 16,695 | 5 | 2,534 | 5,069 | 13 | 6,417 | 21,764 |

(අ) අර්ධ රාජ්‍ය සහ අනෙකුත් පෞද්ගලික ආයතන ඇතුළත් වේ.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලය: කම්කරු දෙපාර්තමේන්තුව



සේවකයන්ට පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මෙහෙයුම් කටයුතු දීප ව්‍යාප්තව වැඩි දියුණු කිරීමේ අරමුණින් සෑම පළාතකම සංක්‍රමණික සම්පත් මධ්‍යස්ථාන පිහිටුවීමට ද පියවර ගෙන තිබේ.

## කම්කරු සබඳතා සහ ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණ

**2018 වසරේ දී පෞද්ගලික අංශය තුළ කම්කරු සබඳතා දුර්වල වූ අතර, වැඩ වර්ජන සංඛ්‍යාව සියයට 48.5 ක සැලකිය යුතු මට්ටමකින් සහ වැඩ වර්ජන සඳහා සහභාගි වූ සමස්ත සේවක සංඛ්‍යාව සියයට 14.4 කින් ඉහළ ගියේය.** කෙසේ වුවද, අදාළ වසර තුළ වැඩ වර්ජන හේතුවෙන් අහිමි වූ මිනිස් දින ගණන සියයට 14.4 කින් පහළ ගියේය. ඒ අනුව, 2018 වසරේ දී සේවකයන් 12,485 ක් වැඩ වර්ජන 49 කට සහභාගී වී ඇති අතර, එමගින් මිනිස් දින 51,423 ක් අහිමි විය. ඉහත ආකාරයට වැඩ වර්ජන සංඛ්‍යාව හා වැඩ වර්ජන සඳහා සහභාගී වූ සමස්ත සේවක සංඛ්‍යාව ඉහළ යෑම සඳහා වැවිලි අංශයේ පැවති වැඩ වර්ජන සංඛ්‍යාව සහ එම වැඩ වර්ජන සඳහා සහභාගී වූ සේවක සංඛ්‍යාව සැලකිය යුතු ලෙස ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, අර්ධ රාජ්‍ය සහ වෙනත් පෞද්ගලික ආයතන තුළ මෙම තත්ත්වවල පැහැදිලි වෙනසක් දැක ගත හැකි විය. ඒ අනුව, එම අංශවල වාර්තා වූ වැඩ වර්ජන සංඛ්‍යාව සියයට 4.8 ක ආන්තික ඉහළ යෑමක් පමණක් පෙන්නුම් කළ අතර, එම වැඩ වර්ජන සඳහා සහභාගී වූ සේවක සංඛ්‍යාව සහ අහිමි වූ මිනිස් දින ගණන පිළිවෙලින් සියයට 34.2 කින් සහ සියයට 66.5 කින් පහළ ගියේය. පවත්නා තොරතුරු අනුව, රාජ්‍ය අංශයේ ආයතන තුළ විශේෂයෙන්ම, සෞඛ්‍ය, අධ්‍යාපන, තැපැල් සහ ප්‍රවාහන යන ක්ෂේත්‍රවල වැඩ වර්ජන කිහිපයක් ක්‍රියාත්මක විය.

**කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය විසින් 2018 වසරේ දී සේවා ස්ථාන සහයෝගීතාව සහ කාර්මික සමගිය වැඩි දියුණු කිරීම සඳහා පනත් සංශෝධන සහ නෛතික ප්‍රතිපාදන කිහිපයක් හඳුන්වා දීම ඇතුළුව පියවර කිහිපයක් ගන්නා ලදී.** මෙහි දී, පෞද්ගලික අංශයේ සේවයේ නියුතු කාන්තාවන්ගේ මාතෘ ප්‍රතිලාභ ඉහළ නැංවීම උදෙසා 1939 අංක 32 දරණ ප්‍රසූතිකාධාර ආඥා පනතට සහ 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාලීය සේවකයින් පිළිබඳ පනතට සංශෝධන දෙකක් ගෙන එන ලදී. ඒ අනුව, සෑම දරු උපතක් සඳහාම වැඩ කරන දින 84 ක් දක්වා වැටුප් සහිත ප්‍රසූත නිවාඩු ලබා දිය යුතුය. මීට අමතරව, ස්ත්‍රී සේවා නියුක්තිකයන් සඳහා කිරි පැය ලබා දීමට අදාළ නෛතික ප්‍රතිපාදන ද හඳුන්වා දී ඇත. පෞද්ගලික අංශයේ නිෂ්පාදන කර්මාන්ත සඳහා සතියේ වැඩ කරන දින 5 තුළ පමණක් සේවයේ නිරත වීමට අදාළ පරිපාලනමය ලිහිල් කිරීම 2018 වසර සඳහා ද දීර්ඝ කරනු ලැබීය. ජාතික කම්කරු උපදේශක සභාවේ (NLAC) උපදෙස් සහිතව, අවම ජාතික වැටුප සංශෝධනය කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත. තවද, දැනට පවතින කම්කරු නීතිවල පෞද්ගලික අංශයේ සේවා නියුක්තියට අදාළ නියම හා කොන්දේසිවල ඇති අක්‍රමිකතා සහ විෂමතා මගහරවා ගැනීම උදෙසා ‘තනි සේවා නියුක්ති නීතියක්’ හඳුන්වා

දීමට කැබිනට් අනුමැතිය ලබා දී තිබේ. යෝජිත පනත තුළ වෙනස්කම්වලින් තොර පූර්ණ හා ඵලදායි සේවා නියුක්තිය තහවුරු කිරීමට, සේවා ස්ථානවල සිදුවන ලිංගික හිංසන වැළැක්වීමට සහ නම්‍යශීලී සේවා මුර ක්‍රමය හඳුන්වා දීමට අදාළ නෛතික විධිවිධාන ද ඇතුළත් කිරීමට නියමිතය. තවද, ගෘහාශ්‍රිත සේවාවල නියුතුවන්නන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරනු පිණිස ඔවුන්ව කම්කරු නීතිය මගින් ආවරණය කිරීමට ද කැබිනට් අනුමැතිය ලබා දී ඇත. එසේම, අමාත්‍යාංශය මගින් බලහත්කාරී ශ්‍රමය වැළැක්වීමට හා පිටු දැකීමට අවශ්‍ය පියවර ද ගනිමින් සිටී. තවද, උපද්‍රවකාරී රැකියා ලැයිස්තුව සංශෝධනය කර ඇති අතර, එය කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට ද අපේක්ෂිතය. පෞද්ගලික අංශයේ සේවා ස්ථාන සහයෝගිතාව සහ කාර්මික සමගිය වැඩි දියුණු කිරීම සඳහා, කම්කරු දෙපාර්තමේන්තුවේ සමාජ සංවාද ඒකකය විසින් දැනුවත් කිරීමේ වැඩසටහන්, වැඩමුළු සහ කර්මාන්ත මට්ටමින් දීප ව්‍යාප්ත තරඟයක් පවත්වන ලදී. තවද, සේවා ස්ථානවල ගැටුම් අවම කොට ඵලදායිතාව ඉහළ නැංවීමේ අරමුණින් කම්කරු දෙපාර්තමේන්තුව විසින් සමාජ සංවාද කතිකාවතක් ද ආරම්භ කර ඇත. මීට අමතරව, කාර්මික සමගිය සහ එකමුතුකම වැඩි දියුණු කරනු පිණිස ගැටුම් සමථකරණ ක්‍රමවේදය ශක්තිමත් කිරීමට ද පියවර ගෙන ඇත.

### ශ්‍රම ඵලදායිතාව

**වැඩ කරන ලද පැයකට එකතු කළ අගය (2010 මිල අනුව) වශයෙන් මනිනු ලබන ශ්‍රම ඵලදායිතාව, 2018 වසරේ මුල් කාර්තු තුන තුළ දී 2017 වසරේ අදාළ කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ පැයකට රුපියල් 459.85 සිට පැයකට රුපියල් 500.56 දක්වා සියයට 8.9 කින් ඉහළ ගියේය.** මෙම ඉහළ යෑම සඳහා සමස්ත එකතු කළ අගයේ සුළු වර්ධනයට අමතරව රැකියා නියුක්ත ජනගහනයේ අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. ඒ අනුව, 2018 වසරේ පළමු කාර්තු තුන තුළ දී කෘෂිකර්මාන්ත, කර්මාන්ත හා සේවා යන අංශවල ශ්‍රම ඵලදායිතාව පිළිවෙලින් සියයට 8.89, සියයට 10.43 සහ සියයට 8.18 වශයෙන් ඉහළ ගියේය. කෙසේ වුවද, 2018 වසරේ පළමු කාර්තු තුන තුළ දී කෘෂිකර්මාන්ත අංශයේ ශ්‍රම ඵලදායිතාව පැයකට රුපියල් 182.19 ක් වූ සැලකිය යුතු අවම අගයක පැවති අතර, සමස්ත සේවා නියුක්ත ජනගහනයෙන් හතරෙන් එකකට තරමක් වැඩි ප්‍රමාණයක් කෘෂිකර්මාන්ත අංශයේ සේවයේ නිරත වීම ඒ සඳහා හේතු විය. 2018 වසරේ පළමු කාර්තු තුන තුළ දී කර්මාන්ත අංශයේ සහ සේවා අංශයේ ශ්‍රම ඵලදායිතාව පිළිවෙලින් පැයකට රුපියල් 528.17 ක් සහ පැයකට රුපියල් 613.91 ක් විය.

**4.14 සංඛ්‍යා සටහන**

**ප්‍රධාන ආර්ථික අංශ අනුව ශ්‍රම ඵලදායිතාව (අ)**

| ශීර්ෂය | 2017 (ආ) | 2017 (පළමු කාර්තු තුන) (ආ) | 2018 (පළමු කාර්තු තුන) |
|---|---|---|---|
| ස්ථාවර (2010) මිල අනුව දළ එකතු කළ අගය (රුපියල් මිලියන) | **8,449,194** | **6,226,563** | **6,483,935** |
| කෘෂිකර්මාන්ත | 642,366 | 463,578 | 486,068 |
| කර්මාන්ත | 2,495,721 | 1,860,815 | 1,906,916 |
| සේවා | 5,311,107 | 3,902,170 | 4,090,950 |
| ශ්‍රම ඵලදායිතාව, වැඩ කරන ලද පැයක් සඳහා රුපියල් | **464.35** | **459.85** | **500.56** |
| කෘෂිකර්මාන්ත | 169.06 | 167.32 | 182.19 |
| කර්මාන්ත | 477.35 | 478.29 | 528.17 |
| සේවා | 579.33 | 567.49 | 613.91 |

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**පවත්නා යෙදවුම් ප්‍රමාණයෙන් වැඩි භාණ්ඩ හා සේවා ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීම මගින් පරිභෝජනය වැඩි දියුණු කිරීමටත්, එමගින් රටක ජීවන මට්ටම ඉහළ නැංවීමටත්, ශ්‍රම ඵලදායිතාව වැඩි දියුණු කිරීම රටකට ඉතා වැදගත් වේ.** කෘෂිකර්මාන්ත අංශයට ලබා දෙන සහනාධාර එහි ඵලදායිතාව ඉහළ නැංවීමට අහිතකර ලෙස බලපා ඇති අතර අඩු ඵලදායි/ අඩු ආදායම් ජීවනෝපායවල විශාල ජනගහනයක් නිරතව සිටියි. එම නිසා කෘෂිකර්මාන්ත අංශයේ ශ්‍රම ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ඉහළ තාක්ෂණික ක්‍රමවේද භාවිතය, ඉඩම් භාවිතය මෙන්ම බෝග සම්මිශ්‍රණය පිළිබඳ නැවත සලකා බැලීම සහ වඩාත් ඵලදායි පරිච ක්‍රියාත්මක කිරීම ආදිය කෙරෙහි අවධානය යොමු කළ යුතුය. මීට අමතරව, සමස්ත ශ්‍රම ඵලදායිතාව ඉහළ නැංවීම සහ ශ්‍රම හිඟයට පිළියමක් ලෙස මෙන්ම ආර්ථික වර්ධනය උත්තේජනය කරනු පිණිස කෘෂිකර්මාන්තය වටා සංකේන්ද්‍රණය වී ඇති ශ්‍රමය, කර්මාන්ත සහ සේවා අංශ වෙත යොමු කළ යුතුය. සේවා අංශය ආර්ථිකයෙහි ඉහළම වර්ධනීය විභවතාව සහිත අංශය ලෙස සනාථ වී ඇත. සමස්තයක් ලෙස, ආර්ථික වර්ධනය වේගවත් කිරීම සහ වැඩි වටිනාකමක් සහිත රැකියා නිර්මාණය කිරීම සඳහා, ඉහළ ඵලදායි කෘෂිකර්මාන්තය වෙත විතැන් වීමට; සාම්ප්‍රදායික සේවාවන්ගේ සිට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය හා වෘත්තීය සේවා වැනි නවීන සේවා වෙත යොමු වීමට; සහ ස්වයංක්‍රීය නොවන හෝ අඩු තාක්ෂණික නිෂ්පාදන වෙනුවට ඉහළ තාක්ෂණික නිෂ්පාදන වෙත යොමු වීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කෙරෙහි අවධානය යොමු කළ යුතුය.